81 වන කාණ්ඩය
4 වන කලාපය
(II වන කොටස)

8 ඉරිදා
1968 සැප්තැම්බර් 1

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

(අශෝධිත පිටපත)

අන්තර්ගත ප්‍රධාන කරුණු

විසර්ජන පනත් කෙටුම්පත, (1968-69) [දෙළොස්වන වෙන් කළ දිනය]
55 වන ශීර්ෂය කාරක සභාව විසින් සලකා බලන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 81
இல. 4
(பகுதி II)

ஞாயிற்றுக்கிழமை
1 செப்ரம்பர் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

பிரதான உள்ளடக்கம்


ஒதுக்கீட்டு மசோதா, 1968–69 [ஒதுக்கப்பட்ட பன்னிரண்டாம் நாள்]
குழுவில் ஆராயப்பட்ட தலைப்பு 55


---

Volume 81
No. 4
(Part II)

Sunday
1st September, 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

(Uncorrected)

PRINCIPAL CONTENTS


APPROPRIATION BILL, 1968-69 [Twelfth Allotted Day]
Considered in Committee Head 55



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

### 1968 සැප්තැම්බර් 1 වන ඉරිදා

ஞாயிற்றுக்கிழமை, 1, செப்டம்பர் 1968

*Sunday, 1st September, 1968*

---

[1968 සැප්තැම්බර් 1 වන ඉරිදා නිල වාර්තාවේ 958 වන තීරයේ සිට ඉතිරි කටයුතු]

[1968 செப்டம்பர் 1, ஞாயிற்றுக்கிழமைய அதிகார அறிக்கை 958 ஆம் பந்தியிலிருந்து நிகழ்ச்சித் தொடர்.]

[*Continuation of Proceedings from Col. 958 of* OFFICIAL REPORT *for Sunday, 1st September 1968.*]

## විසර්ජන පනත් කෙටුම්පත, 1968/69

*ஒதுக்கீட்டு மசோதா, 1968-69*

## APPROPRIATION BILL, 1968-69

**එච්. එම්. නවරත්න මයා.** (මිනිපෙ)
*(திரு. எச். எம். நவரத்ன—மினிப்பே)*
(Mr. H. M. Nawaratna—Minipe)

ගරු සභාපතිතුමනි, සියයට සියයක්ම ගොවි ජනතාව පදිංචිව සිටින ආසනයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් මට ඉඩම් ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා ඉතාමත්ම සන්තෝෂ වෙනවා. ඇත්ත වශයෙන්ම ඉඩම් ඇමතිතුමා ගැන මා කණගාටු වෙනවා. මක්නිසාද ? විසිවන ශත වර්ෂයේ ලංකාවේ පහළ වී සැමදාම බැණුම් අසන එකම ඇමතිවරයා එතුමා නිසයි. එතුමා සැම ආණ්ඩුවකම සැම කැබිනට් මණ්ඩලයකම ඉඩම් අමාත්‍යාංශ යම දරමින් සැමදාම බැණුම් අසනවා. ඒ ගැන මා කණගාටු වෙනවා.

මිණිපේ ව්‍යාපාරය ගැන එතුමා දන්නවා ඇති. මිණිපේ ව්‍යාපාරය ගැන ඇත්ත වශයෙන්ම එතුමා විශේෂ උනන්දුවක් දක්වා වැඩ කළා. ඒ ව්‍යාපාරය සම්බන්ධව අද පැනනගී තිබෙන ප්‍රශ්න දෙක තුනක් මා තමුන්නාන්සේට ඉදිරිපත් කරන්නට අදහස් කරනවා. මිණිපේ ජනපදයේ ගොවි ජනතාවට දී තිබෙන ඉඩම්වලින් අක්කර 29 ක් එම්. බී. ඩබ්ලිව්. මැදිවක මහත්මයාට දී තිබෙන බව තමුන්නාන්සේ. දන්නවාද ? තමුන්නාන්සේගේ ස්ථිර ලේකම්වරයා ගෙනුත් ශ්‍රී කාන්ත මහත්මයාගෙනුත් මා ඒ ප්‍රශ්නය ඇසුවා. මිණිපේ කොට්ඨාශය තුළ කොයි තරම් දුප්පත් ජනතාව සිටිනවාද කියා පාර්ලිමේන්තු ලේකම්තුමා දන්නවා. එතුමා බොහොම උදව් කරනවා. ඒ ගැන මා එතුමාට ස්තුති කරනවා. මිණිපේ කොට්ඨාශයේම ජනිත වූ රජයේ ඉඩම් අගලක්වත් නැති ගොවීන් විශාල සංඛ්‍යාවක් සිටිනවා. එවැනි ගොවීන් සිටිය දී මිණිපේ ජනපදය තුළින්ම, පල්ලේ වත්ත දුම්කොළ බාන් නමැති ඉඩමෙන් මැදිවක මහත්මයාට අක්කර 29 ක් දුන්නේ කෙසේද කියා මා ප්‍රශ්න කරනවා. කලින් මේ ප්‍රශ්නය ස්ථිර ලේකම්තුමාට ඉදිරිපත් කළා. හසලක වැවට මැදිවක මහත්මයාගේ ඉඩම් යට වූ නිසා මේ ඉඩම් දී තිබෙනවාය කියා ඒ මහත්මයා කිව්වා. හසලක වැවට මැදිවක මහත්මයාගේ අක්කර 3 ක් පමණ යට වූ බව මා පිළිගන්නවා. ඇත්ත වශයෙන්ම අක්කර 3ක්වත් නැහැ. නමුත් දැන් එම නිසාය කියා රජයේ ඉඩම් අක්කර 29 ක් දී තිබෙනවා. මේ ඉඩම්වල සිටින ගොවීන් බලහත්කාරයෙන් එළවන්නට ගිහින් දැන් සැමදාම පොලීසියට පැමිණිලි ගලා එන බව තමුන්නාන්සේ දන්නවාද ? සැමදාම රණ්ඩු කෝලාහල වන බව තමුන්නාන්සේ දන්නවාද ? ගරු ඇමතිතුමා මේ ඉඩම් දුන්නාය කියා මැදිවක මහත්මයා කෙලින්ම කියනවා. ඇමතිතුමාගේ නියෝගයක් අනුව දුන්නාය කියා ස්ථිර ලේකම්තුමා කියනවා. ඇමතිතුමා මොන මොන නියෝග දෙනවාද කියා මා දන්නේ නැහැ. රජයේ ඉඩම් අගලක්වත් නැති දුප්පත් ගොවීන් මිණිපේ කොට්ඨාශය තුළ කොයි තරම් සිටිනවාද ? තමුන්නාන්සේගේ ඉඩම් දෙපාර්තමේන්තුවෙන් ඉඩම් දෙන්නේ මේ විධියටද ?

ඇත්ත වශයෙන්ම මේ කරුණු ගැන ගරු ඇමතිතුමා වගකිව යුතුයි. 1958 දී තමුන්නාන්සේ හසලක ව්‍යාපාරය ආරම්භ කළා. ඒ හසලක ව්‍යාපාරය තුළිනුත් දොළහඇලේ අක්කර 60 ක් දදිගම හාමුදුරුවන්ට දී තිබෙනවාද, නැද්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මා දන්නේ නැහැ. කොහේද?

**නවරත්න මයා.**
*(திரு. நவரத்ன)*
(Mr. Nawaratna)
දොළුහඇලෙන් අක්කර 60 ක් දී තිබෙනවා. ජනතාවට අක්කර දෙක බැගින් බෙදා දෙන ජනපදය තුළින් තමයි මේ ඉඩම් දී තිබෙන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒක මට අළුත් පුවතක්. මා ඒ ගැන සොයා බලන්නම්.

**නවරත්න මයා.**
*(திரு. நவரத்ன)*
(Mr. Nawaratna)
මහනුවර සංචාරක කච්චේරිය මිණිපෙට පැමිණි අවස්ථාවේදී මේ හාමුදුරුවො දිසාපතිතුමාට ලියුම දුන්නා. ඒ අවස්ථාවේදී මහජනතාව විරුද්ධ වුණා. එතකොට දිසාපතිතුමා තමුන්නාන්සේටත් දෙපාතීමේන්තුවටත් ලියුමක් එව්වා. මේ හාමුදුරුවන්ට අක්කර 60 ක් දෙන්නට බැරිය කියා. නමුත් කෙසේ හෝ ඒ ඉඩම් දෙන්නය කියා නැවතත් නියෝගයක් ඇවිත් තිබෙනවා. ඒ අනුව දන් ඒ හාමුදුරුවන්ට ඉඩම් දී තිබෙනවා. ඒ ගැන සොයා බලන්න.

තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ පවතින ඉඩම් දෙපාතීමේන්තුවේ කොයි තරම් වැරදි තිබෙනවාද කියා තමුන්නාන්සේ දන්නේ නැතිව ඇති. මට ප්‍රථමයනේ කථා කළ වත්තේගම ගරු මන්ත්‍රීතුමා (වීරකෝන් මයා.) තමුන්නාන්සේගේ ගුණ කිව්වා. මහවැලි ගඟ පොල්ගොල්ල වත්තෙන් හරවන්නට තමුන්නාන්සේ හුඟක් මහන්සිවුණාය කියා එතුමා කිව්වා. මා ඒ ගැන කියන්නට යන්නේ නැහැ. නමුත් ඒ සමගම පිඟාඔය හැරවීම සම්බන්ධවත් අප තුළ විශාල බලාපොරොත්තුවක් තිබුණු බව තමුන්නාන්සේලාට මතක ඇති.

වත්තේගම ගරු මන්ත්‍රීතුමා තමුන්නාන්සේගේ ගුණ වර්ණනා කරමින් එනසාල් වැවීමට වත්තේගමින් ඉඩම් දී තිබෙන බවත්, මහජනතාව ළඟදීම ඒවායේ පලදාව ලබා ගන්නා බවත්, කියා සිටියා. කොත්මලේට පමණක් දෙවැනි තැනක් ගන්නා තරමට එනසල් වගාවට මුළු ලංකාවේම විශාල ප්‍රසිද්ධියක් දරන්නේ උඩදුම්බර හුන්නස්ගිරිය ප්‍රදේශය බව තමුන්නාන්සේ දන්නවා.

මිණිපේ මැතිවරණ කොට්ඨාශයටයි මේ ප්‍රදේශය අයිති. මීට අවුරුදු දෙකහමාරකට පමණ පෙර උඩදුම්බර නැගෙනහිර කෝරළයේ ගංගොඩ වසමේ පිටවල නම් ගමේ එනසල් මඩිත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමක් ගොවීන් අතර බෙදා දීම සඳහා මහනුවරදී ඉඩම් කච්චේරියක් පවත්වනු ලැබුවා. ගොවිතැන් කරන්නට බලාපොරොත්තුවෙන් ගෙවින් බොහෝ දෙනා පෝර පවා සොයාගෙන සූදානමින් කාලයක් තිස්සේ සිටියා. එහෙත් තවමත් ඒ ඉඩම් ගෙවීන්ට දී නැති බව කියන්නට සිදු වී තිබෙනවා. එදා තෝරා ගන්නා ලදැයි කියන එකම එක ගොවියකුටවත් අද වනතුරු ඔය කියන ඉඩම් ලැබී නැහැ. මිණිපේ ආසනයේ ගම් දෙකේ කෝරළය ගැන මීට පෙර අයවැය විවාදයේදී මා මතක් කළා. පල්ලේගල දෙබොක්කේ ගැරඩි ඇල්ල ප්‍රදේශයේ එනසල් වැවීමට ඒ කාලයේදී ඉඩම් බෙදා දුන්නා. සමහර අයට ආධාර මුදල්ද ලැබුණා. රුපියල් විසිපහ, පණහ ආදි වශයෙන් මුදල් ලැබුණු ගොවීන් ඉන්නවා. අද වනතුරු ඒ හැර වෙන කිසිම ආධාර මුදලක් කිසිම ගොවියකුට ලැබී නැහැ. පැල දාහක් ගැනීමට රුපියල් දෙසියයක් පමණ වැය කරන්නට සිදු වෙනවා. සමහර අය අතින් මුදල් වියදම් කර තිබෙනවා. ඒ අයට කිසිම දෙයක් ලබා ගන්නට බැරි වුණා. උඩදුම්බර ජනතාවට ඔය තත්ත්වය දැන් උදා වී තිබෙනවා. කොහිලමඩ ලියන්ගොල්ල ප්‍රදේශයේත් ඉඩම් දෙන්නට සූදානමක් තිබුණා. අද වනතුරුම ඉඩම් දීලා නැහැ. වත්තේගම ගරු මන්ත්‍රීතුමා (වීරකෝන් මයා.) එනසල් වවන්නට ඉඩම් බෙදන්නට යන වගක් කිව්වා. වත්තේගම ප්‍රදේශයට වෙන්නට ඇති, ඒ. ගරු ඇමතිතුමා මිණිපේ ආසනයේ ජනතාවට දැන් කුඩම්මාගේ සැලකිලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දක්වනවාද? එහෙම නැතිව ඒ අයටත් මේ රටේ පුරවැසියන් හැටියට නිසි සැලකිලි දක්වනවාද? ඒ ගැන මා තුළ අවිශ්වාස යක් තිබෙනවා.

ඉඩම් ඇමතිතුමාගේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා නම් මහියංගන කොට්ඨාශයට වැඩ කරන කෙනෙක්. මැදිවක උන්නැහේගේ ගෝරියෙන් පස්සේ ගරු ඇමතිතුමා කෙරෙහි මා තුළ ලොකු අවිශ්වාසයක් ඇති වෙලා තියෙනවා. උන්නැහේට අක්කර 29 ක්ම දුන්නේ යාළුමිත්‍රකම් උඩ බව මට දැනගන්නට ලැබී තිබෙනවා. ලබන ඡන්දවේදී එක්සත් ජාතික පක්ෂයෙන් තරඟ කරන්නට මැදිවක උන්නැහේ එනවාය කියන නිසා උන්නැහේට සැලකුවාය කියන චෝදනාවක් තියෙනවා. ඒ විධියට සලකනවා නම් ඒ බව කියන්න. ගරු ඇමතිතුමා මිණිපේ ජනතාවට නම් සලකන්නේ කුඩම්මා කෙනකුගේ සැලකිල්ලේ හැටියට බව අපි දන්නවා. පිටස්තර උදවිය එනවාට විරුද්ධව යමක් කියන්නේ නැහැ. ඒකට කමක් නැහැ. ඒ වුණාට ඔය ධනපති මුදලාලිලා පදිංචි වෙනවාට නම් මා කවදත් විරුද්ධයි. ගොවීන් නම් ඕනෑ තරම් පදිංචි වුණාට මොන විධියකින්වත් මගේ විරුද්ධත්ව යක් නැහැ.

අ. භා. 4.15

අසමෝදගං වතු යාය ගැන තමුන්නාන්සේ දන්නවා. 1960 මාර්තු මැතිවරණයේදී ඒ ප්‍රදේශයේ ගොවීන්ට එයින් ඉඩම් දෙන්නට පොරොන්දු වුණා. ගොඩ ඉඩම් අක්කරය බැගින් පමණයි දුන්නේ. ගෙවල් තනා ගැනීමට පමණයි ඉඩම් දුන්නේ. ගොවීන්ට දුන් ඒ ඉඩම් අක්කරය ගොඩ ගොවිතැන් කිරීමට පමණයි දී තිබෙන්නේ. මඩ ඉඩම් ලැබී නැහැ. ගොඩ ඉඩම් අක්කරයකින් පවුලකට ජීවත් වන්නට පුළුවන්ද? කොහොමද ඒ තරම් සුළු බිම් ප්‍රමාණයකින් ජීවත් වන්නට පුළුවන් ආදායමක් ලබා ගන්නේ? ඒ විධියේ තත්ත්වයක් අද ඒ ප්‍රදේශවාසීන්ට උදා වෙලා තියෙනවා. අයවැය විවාදයේදී මීට පෙරත් මේ ගැන මම කිව්වා. අපට කිසිම සේවයක් ඇති වුණේ නැහැ.

ගරු ඇමතිතුමාට ස්තුති කරන්නට පුළුවන්කමක් නැහැ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ස්තුති කරන්නට ඕනෑ. අවුරුදු ගණනාවක් තිස්සේ කරවා ගන්නට බැරි වූ දේවල් හසලක ප්‍රදේශයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට කරන්නට පුළුවන් වෙලා තියෙනවා. ඒ නිසා තමුන්නාන්සේට නොවෙයි මගේ ස්තුතිය හිමි වන්නේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්මයා ඇතුළු නිලධාරි මණ්ඩලය ගොවීන්ගේ දුක දැක එය තමන්ගේ දෙයක් හැටියට සලකා වැඩ කළ බව ප්‍රකාශ කරන්නට ඕනෑ. ඩී. අයි. රෝස මහත්මයාටත් සිල්වා ඉංජිනේරු මහත්මයාටත් විශේෂයෙන් ස්තුති කරන්නට ඕනෑ.

**ආර්. පී. විජේසිරි මයා. (කුණ්ඩසාලේ)**
*(திரு. ஆர். பீ. விஜேசிறி—குண்டசாலை)*
(Mr. R. P. Wijesiri—Kundasale)

ඔහොම කියාගෙන යනකොට අන්තිමේදී ගරු ඇමතිතුමාටයි ස්තුතිය හිමි වන්නේ.

**නවරත්න මයා.**
*(திரு. நவரத்ன)*
(Mr. Nawaratna)

කුණ්ඩසාලේ මන්ත්‍රීතුමා වැඩ කර තිබෙන බව ඇත්තයි. කුණ්ඩසාලේ එක්තරා ප්‍රමාණයක වැඩ කර තිබෙනවා. ඒ නිසා එතුමා ඒ ගැන දන්නවා ඇති. මාත් ඒ බව දන්නවා. ඒ ගැන සන්තෝෂයි.

ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ඉඩම් නිරවුල් කරගෙන යනවා. සමහර තැන්වල ඉඩම් පිළිබඳ තත්ත්වය කනගාටුදායකයි. දනට සමහර ඉඩම්වල තත්වය ගැන බලන කෙනකුට පෙනී යන්නේ මායිම් අනුව නම් කුරහන් නැලි 25ක වප සරිය තිබෙන ඉඩමක ඇත්ත වශයෙන්ම තිබෙන්නේ නැලි පහළොවක විස්සක වප සරියක් පමණක් බවයි. මේ අන්දමට ඉඩම් නිරවුල් කරගෙන යන විට සමහර විට ඔප්පුව තිබෙන මිනිහට තමන්ගෙ ඉඩම ලැබෙන්නෙ නැහැ. ඔහුට වෙන තැනකින් ඉඩමක් දෙන්නටයි, සිදු වෙන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒක කරන්නෙත් මම පුද්ගලික වශයෙන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නවරත්න මයා.**
*(திரு. நவரத்ன)*
(Mr. Nawaratna)

තමුන්නාන්සෙගෙ දෙපාර්තමේන්තුවක්. ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවත් අලුත් ක්‍රමයකට සකස් කරල මහ ජනයාට වඩා ඉක්මණින් ඉඩම් නිරවුල් කර දීමට ඒ දෙපාර්තමේන්තුව උනන්දු කරවන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

**සෝමරත්න සෙනරත් මයා. (අම්පාරෙයි)**
*(திரு. சோமரத்ன செனரத்—அம்பாறை)*
(Mr. Somaratne Senerath—Amparai)

ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යංශය යටතේ අදහස් කිපයක් පමණක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනව. පළමුවෙන්ම ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය ගැන වචනයක් දෙකක් ප්‍රකාශ කිරීමටයි, මා අදහස් කරන්නෙ. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ සේවක ප්‍රශ්න මේ අවස්ථාවේ ඉතාම උග්‍ර වී තිබෙනවා. උඩ වලවේ ව්‍යාපාරය පටන් ගැනීමෙන් පසුව අම්පාරේ සිටින සේවක සංඛ්‍යාව වැඩිය කියන මතයක් මේ ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට පහළ වී තිබෙනව. සංවර්ධන මණ්ඩලයේ අම්පාරේ අංශයේ සේවකයන් වැඩිපුර සිටින්නට පුළුවන් බව එක අතකින් මම පිළිගන්ට කැමතියි. එහෙත් මෙය හිතා මතාම කළ දෙයක් හැටියටයි, මට පිළිගන්ට සිදු වී තිබෙන්නෙ. මම එහෙම කියන්නෙ ඇයි? උඩ වලවේ ව්‍යාපාරය පටන් ගන්න විට සංවර්ධන මණ්ඩලයට යුතුකමක් තිබුණ, අම්පාරේ හිටිය සේවකයන් ක්‍රමානුකූලව ටිකින් ටික උඩ වලවේ ව්‍යාපාරයට මාරු කර හරින්න. ඒක කළේ නැහැ. එසේ නොකර උඩ වලවේ ව්‍යාපාරයේ සේවයට අළුත් සේවක පිරිස් බඳවා ගත්ත. ඒ නිසා අද අම්පාරෙ සිටින සේවකයන්ට යන එන මං නැතිවයි තිබෙන්නේ. ඔවුන් දොරට දමන්න ඔන්න මෙන්න කියායි තිබෙන්නෙ. මේක සිද්ධ වුණේ මොන හේතුවක් නිසාද? මහජනයාට වැඩි වැඩියෙන් රක්ෂා දීම ගැන මම විරුද්ධ නැහැ. එහෙත් අවුරුදු දහය, පහළොහ, විස්ස ආදි වශයෙන් සේවය කළ සේවකයන් එළියට දමා අමුතුවෙන් සේවක පිරිසක් බඳවා ගැනීම යුතුකමක් නොවෙයි. කෙසේ හෝ මේ වරද සිදු වී තිබෙනව. ස්ථිර ලේකම්තුමා ඇතුළු නිලධාරීන් පිරිසක් අගමැතිතුමා හමුවුණු අවස්ථාවකදී අගමැතිතුමා ප්‍රශ්න කර තිබෙනව, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට වැඩිපුර සේවකයන් ගත්තෙ කොහොමද කියා. ඒ අවස්ථාවෙදි සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන්ට උත්තරයක් නැතිව ගොස් තිබෙනව. සංවර්ධන මණ්ඩලයේ සේවයෙ යෙදී සිටින පුහුණු වූ වැදගත් සේවක පිරිසක් මේ අළුත් සේවකයන් නිසා එළියට දමන්න. කිසිසේත්ම යුතුකමක් නැහැ.

සංවර්ධන මණ්ඩලයේ වයස අවුරුදු 55 සම්පූර්ණ වූ සේවකයන් අස් කර දමන්ට දැන් වැඩ පිළිවෙල යොදා හමාරයි. අද උදේ ඒ සේවකයන් සමග ගරු ඇමතිතුමා හමුවී මම ඒ ප්‍රශ්නය ගැන සාකච්ඡා කළා. සිරිතක් වශයෙන් දෛනික වැටුප් ලබන සේවකයන් සංවර්ධන මණ්ඩලය අස් කළේ අවුරුදු 60 සම්පූර්ණ වූ පසුවයි. මේ ඊයෙ—පෙරේදා අලුත් නීතියක් සම්මත කරගෙන තිබෙනව, අවුරුදු 55 න් ඒ උදවියගේ සේවය අහෝසි කරන්න. ඇයි, මේ නීතිය ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට පමණක් සීමා වෙන්නෙ? ආණ්ඩුවේ අනිකුත් සංස්ථාවලට මේ නීතිය බල නොපවත්වන්නෙ ඇයි? සංවර්ධන මණ්ඩලයේ අවුරුදු 55 සම්පූර්ණ වූ සේවකයන්ට විතරක් ගෙදර යන්ට කීමේ සාධාරණකමක් තිබෙනවාද? අනික් ප්‍රශ්නය, දෛනික වැටුප් ලබන සේවකයන්ට විතරක් මේ නීතිය බලපාන්නෙ ඇයි කියන එකයි. මාසික වැටුප් ලබන අවුරුදු 67 ක් වයස් වූ නිලධාරීන් සංවර්ධන මණ්ඩලයේ සේවය කරන බව මා දන්නවා. මාසික වැටුප් ලබන අවුරුදු 60 පැන්න නිලධාරීන් විශාල පිරිසක් ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ සේවය කරනව. එහෙම නම් දෛනික වැටුප් ලබන අවුරුදු 55 සම්පූර්ණ වූ කම්කරුවන් පමණක් එළියට දැමීමේ සාධාරණකමක් තිබෙනවාද? එය නීතියක් නැත්නම් ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත් දෙයක් නම් මාසික වැටුප් ලබන අනිකුත් සේවකයිනුත් අවුරුදු 55 න් එළියට දමන්නට ඕනෑ. ඔවුන් අවුරුදු 55 න් එළියට දමන්නය කියා මා කියනවා නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුදු 55 න් එළියට දැමීම ප්‍රතිපත්තියක් වශයෙන් කරනවා නම් එසේ විය යුතු බවයි මා කියන්නේ. දෛනික වැටුප් ලබන අය අවුරුදු 55 න් එළියට දමන නමුත් අවුරුදු 67 ක් වූ මාසික වැටුප් ලබන අය සිටින බව මා දන්නවා. අවුරුදු 60 න් රජයේ සේවයෙන් විශ්‍රාම ලබා එන අයට මෙය පාරාදීසයක් වී තිබෙනවා. එදත් එහෙමයි; අදත් එහෙමයි. මා කියන්නේ යම් සාධාරණත්වයක් තිබෙන්නට ඕනෑය කියන එකයි.

වයස 55 න් විශ්‍රාම යා යුතු කම්කරු පිරිසකුත් සමග අද උදේ මා ගරු ඇමතිතුමා හමු වී ඔවුන් වෙනුවෙන් එක ඉල්ලීමක් කළා. ඇමතිතුමා හමු වූ ඒ පිරිසත් මාත් ඉල්ලා සිටියේ නියමිත කාලයට කලින් සේවයෙන් දොට්ට දමනවා නම් අඩු වශයෙන් මාස තුනක වැටුපවත් ඔවුන්ට දෙන්නය කියලයි. ගරු ඇමතිතුමා එය පිළිගෙන ඒ ගැන කටයුතු කිරීම ස්ථිර ලේකම්තුමාට පැවරුවා. ඒ අනුව නියමිත කාලසීමාවට කලින් දොට්ට දමනවා නම් අඩු වශයෙන් ඔවුන්ට මාස තුනක පඩියවත් දෙන්නට ඕනෑ. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අද උදේ ගරු ඇමතිතුමා පොරොන්දු වීම ගැන මා සතුටු වෙනවා.

ගරු සභාපතිතුමනි, ඊළඟට ගල්ඔය මහ කම්හල ගැන යමක් කියන්නට ඕනෑ. එය සේවකයින් 3,000 ක් පමණ සිටින විශාල කම්හලක්. එහෙත් එහි කිසිම පරිපාලනයක් නැහැ. අවුරුද්දක දෙකක සිට මෙහි නියම පාලනයක් නැහැ. පුහුණුව ලබා ඇති ඒ සේවකයින්ගෙන් නියම ප්‍රයෝජනයක් ලබාගන්නේ නැහැ. එය මා කියන කියමනක් පමණක් නොවෙයි, ක්‍රම සම්පාදක දෙපාර්තමේන්තුවෙන් මේ පිළිබඳව කොමිටියක් පත් කර විභාග කර පරීක්ෂණ පවත්වා ඉදිරිපත් කර තිබෙන වාර්තාව අනුවත් එය පැහැදිළි වෙනවා. එම වාර්තාව පසුගිය කාලයේ "ඩේලි නිවුස්" පත්‍රයේ පළ වුණා. එම කම්හලේ පාලනය අඩපණ වී තිබෙනවා යයි එහි කියා තිබුණා. එය කම්කරුවන්ගේ වරද නොවෙයි. එහි සිටින්නේ ඇටවුම් බැහැපු නිලධාරි පිරිසක්. මේ කම්හලෙන් නියම ප්‍රයෝජනයක් ගන්න නම් හොඳ, දක්ෂ, පාලනය ගැන හොඳ අවබෝධයක් ඇති නිලධාරි පිරිසක් පත් කරන්නට ඕනෑ. එහි නොයෙකුත් බඩු තිබෙනවා. වාහන වල අමතර කොටස් අද වැඩි මිලට විකිණෙනවා. මේ කම්හලේ තිබෙන වාහන අමතර කොටස් හැමදාම අතුරුදහන් වෙනවා. පොඩි පොඩි ඒවා පමණක් නොවෙයි, විශාල ඒවාත් අතුරුදහන් වෙනවා. මා දන්නවා ඊයේ පෙරේදා එහි තිබුණු පාස්සන මැෂිමක්—වෑල්ඩිං මැෂිමක්—අතුරුදහන් වුණා. නැති වුණේ කොහොමද කියා කවුරුවත් දන්නේ නැහැ. එපමණක් නොවෙයි. තඹ කම්බි ටොන් 12 කුත් නැති වුණා. ටයරුත් අතුරුදහන් වෙනවා. අර බුල්ඩෝසර් වැනි ලොකු වාහනවල ක්‍රෑන්ක් එකකුත් නැති වුණා. එය මිනිසුන් 10 දෙනකුටවත් ගෙන යන්නට පුළුවන් එකක් නොවෙයි. ටොන් එකක් පමණ බරයි. එයත් නැති වුණා. මේවා කොහාටද යන්නේ? ඒ පළාතේ කොන්ත්‍රාත් අරගෙන වැඩ කරන, ට්‍රැක්ටර් වැනි විශාල වාහන අයිති අය සිටිනවා. මේවා කම්හලෙන් යන්නේ ඒ අයටයි. මේවා කෙරෙන්නේ සම්පූර්ණයෙන්ම නිලධාරීන්ගේ දැනුම ඇතිවයි. එහි පරිපාලනයක් නැහැ. පාලනයක් කරන්නට පුළුවන් ප්‍රධානියකු නැහැ. මේ සියල්ලක්ම සිදු වන්නේ අන්න ඒ නිසයි. ඒ නිසා මේ කම්හලේ කටයුතු සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කර මේ රට සංවර්ධනය කිරීම සඳහා මේ පුහුණු කම්කරුවන්ගෙන් ප්‍රයෝජනයක් ලබා ගන්නා ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

දකුණු ඉවුරේ ඉඩම් ප්‍රශ්නය ගැන ඊළඟට මා වචන කීපයක් කියන්නට කැමැතියි. මීට අවුරුද්දකට පමණ පෙර ගරු අගමැතිතුමාත්, ඉඩම් ඇමතිතුමාත්, සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමාත්, මාත් දකුණු ඉවුරේ ඇවිදින්නට ගිය බව මට මතකයි. එදා එහි ජනතාව අගමැතිතුමාට එක්තරා චෝදනා වගයක් ඉදිරිපත් කළා, එහි කෙරෙන ඉඩම් මංකොල්ලය ගැන. අගමැතිතුමා ඒවා අසා, දකුණු ඉවුරේ ඉඩම් දීම වහාම අවලංගු කොට ඒ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා ඉඩම් කච්චේරි පැවැත්වීම දිසාපතිවරුනට බාර දෙන ලෙස ස්ථිර ලේකම් තුමාට නියෝගයක් කළා. එහෙත් ඒ නියෝගය ක්‍රියාත්මක වුණේ නැහැ. ඉඩම් කච්චේරි පැවැත්වීම දිසාපති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනරත් මයා.]

වරයාට බාර දුන්නේ නැහැ. අදත් ඉඩම් බෙදීම කෙරෙන්නේ නිලධාරීන්ගේ ඕනෑ එපාකම් අනුව මිස, නියම ක්‍රමානුකූලව පැවැත්වෙන ඉඩම් කච්චේරි මාර්ගයෙන් නොවෙයි. අද ඒ ප්‍රදේශයේ ඉඩම් බෙදීම කෙරෙන්නේ ඉඩම් බෙදීමේ ආඥාපනත අනුව නොවෙයි. එදා අගමැතිතුමා දුන් නියෝගය පරිදි මේ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වුණාද, එසේ නම් එහි ප්‍රතිඵල මොනවාද යන වග ප්‍රදේශයේ මන්ත්‍රීවරයා වශයෙන් මා දැන ගන්නට සතුටුයි.

අ. භා. 4.30

එක්තරා නිලධාරි මණ්ඩලයකුත් සේවක පිරිසකුත් එකතු වී දකුණු ඉවුරේ ඉඩම් නොයෙක් ප්‍රදේශවල උදවියට බෙදා දෙන බවට චෝදනාවක් ඇති වී තිබෙනවා. ඒ ගැන වහාම පරීක්ෂණයක් පවත්වන ලෙස දන්වා මා සභාපතිතුමාට විදුලි පණිවුඩයක් යැව්වා. පරීක්ෂණයේදී සාක්ෂි දීම සඳහා මා එක්තරා සේවකයකුත් එහි පිටත්කර යැව්වා. එහෙත්, විජයබාහු විජයසිංහගේ නියෝගයක් පිට එම සේවකයා හෙට සිට උඩ වළවේ ප්‍රදේශයට මාරු කරන ලද බව මට අද උදේ විදුලි පුවතකින් දන්වා එවා තිබෙනවා. කුමන දේශපාලන පක්ෂයක් හෝ හරි දෙයක් නරනවා නම් මට කමක් නැහැ. මේ විධියේ පරාජිත අපේක්ෂකයන්ගේ ගඳ ගහන වැඩ නිසා මේ රජය ජනතාවගේ දෝෂාරෝපණයට ලක් වෙනවා. සාක්ෂි දීම සඳහා මා විසින් යවන ලද සේවකයා මාරු කිරීමේ නියෝගයක් දුන්නේ කවුරුන්ද යන වග මා සෝදිසි කළා. විජයබාහු විජයසිංහගේ නියෝගයක් අනුව එය කෙරුණු බව මට දැන ගන්නට ලැබුණේ එවිටයි. දැන් මෙහි පාලන යන්ත්‍ර දෙකක් තිබෙනවා. එකක් සභාපතිතුමාගේ. අනෙක විජයබාහුගේ යන්ත්‍රය. There are administrations within administrations. The chairman has one administration and Wijayabahu has one administration. I cannot say where they reconcile these things. I know the chairman. He is a strict man no doubt sometimes. He is impervious to reason at times. But nevertheless I admire him. He takes a decision and he sticks by it. But you will have to be careful about this Wijayabahu or Gajabahu. There are a lot of dirty things that he does there. If I only come out with them you will not like it.

නාමල් ඔය ව්‍යාපාරය සම්බන්ධව මා තමුන්නාන්සේට දහ දොළොස් වාරයකට වඩා මේ ගරු සභාවේදී කරුණු කියා තිබෙනවා. නාමල් ඔය ව්‍යාපාරයේ වැවේ දැන් වතුර බින්දුවක්වත් නැහැ. එහි දකුණු ඉවුරෙහි ජනපද දෙකක් පදිංචි කරවා තිබෙනවා. 6බී, 7බී යනුවෙන් තවත් ජනපද දෙකක් තිබෙනවා. ඒ අයටත් දකුණු ඉවුරේ ඉඩම් දී පදිංචි කරවන බවට රජය පොරොන්දුවක් වූ නමුත් තවම එය ඉෂ්ට වුණේ නැහැ. එම නිසා, 6බී සහ 7බී ජනපද දෙකේ වැසියනුත් නාමල් ඔය ව්‍යාපාරයේ දකුණු ඉවුරෙහි පදිංචි කරවන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ කරන බවට ඔවුන්ට ලියුමක් දී තිබෙනවා. ඒ අනුව කටයුතු කරන ලෙස මා මතක් කරනවා.

ඊ ළඟට පොල්වත්තේ තිබෙන ලොකු ප්‍රශ්නයක් ගැන සඳහන් කරන්නට කැමතියි. පොල්වත්තේ ලැබී තිබෙන ඉඩම් සියල්ලටම පාහේ වතුර නැහැ. වතුර තියෙනවා නම් ඒ මිනිසුන් කෑගහන්නෙ නැහැ. සුළු පිරිසකට හැරෙන්නට අනික් සියළු දෙනාටම වතුර නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ළිංද ඉල්ලන්නෙ?

**සෙනරත් මයා.**
*(திரு. செனரத்)*
(Mr. Senarath)

ළිං නොවෙයි, ඉල්ලන්නෙ. ඒ මිනිසුන්ට පොල් අක්කරය බැගින් දී තිබෙනවා. කුඹුරුවලටත් ඉඩම් දී තිබෙනවා. ඒ කුඹුරුවලට වතුර නැහැ. වැඩි දෙනකුට වතුර නැහැ. වතුර නැති උදවියට කරුණාකර කොහෙන් හෝ ඉඩම් දෙන්න. හැමදාම මේ කන්දොස්කිරියාව තියෙනවා. හැමදාම අපට පැමිණිලි කරනවා. හැමදාම ඇමතිතුමාට පැමිණිලි කරනවා; සංවර්ධන මණ්ඩලයට කරුණු කියනවා. මේ ප්‍රශ්නය විසඳන්නට ඕනෑ. මේක මග හරින්නට බැහැ. ඒ මිනිසුන් සේවක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන්. කුඹුරු ඉඩම් දුන්න නිසා ඒ මිනිසුන් අස් කරන්නට යනවා. වතුර නැත් නම් ඒ අය ජීවත් වන්නෙ කොහොමද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
කුඹුරු තියෙන්නෙ කොහේද?

**සෙනරත් මයා.**
*(திரு. செனரத்)*
(Mr. Senarath)
දකුණු ඉවුරේ තියෙනවා. එතැන විශාල ඉඩම් මංකොල්ලයක් තියෙනවා. මිනිසුන් බලහත්කාරයෙන් ඉඩම් අල්ලාගෙන තිබෙනවා. විජයබාහු විජේසිංහ වගේ මිනිසුන් ඒ ගැන ඇස් පියාගෙන ඉන්නවා. එවැනි දේ ගැන පරීක්ෂා කර බලන්නට ඕනෑ. සමහර ඉඩම් වගා කරන්නෙ නැහැ. කාටවත් ඒවා වගා කරන්නට දෙන්නෙත් නැහැ. ඒ ඉඩම්වල මිනිසුන් පහසුවෙන් පදිංචි කරන්නට පුළුවන්. ඒ ඉල්ලීම ඉටු කරන ලෙස ගරු අමතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

පුත්තලඔය ව්‍යාපාරය ගරු ඇමතිතුමා පටන් ගත් ව්‍යාපාරයක්. එය ඇමතිතුමාත්, මාත් ගොස් පළමුවැනි පස් පිඩැල්ල කපා ආරම්භ කළ ව්‍යාපාරයක්. මහා කණ්ඩිය බැඳ ඉවරයි. ප්‍රධාන ඇල හැතැප්ම 4ක් 5ක් පමණ දිගට කපා තිබෙනවා. පසුගිය සතියේ ගොස් මා එය බැලුවා. තව හැතැප්ම 6ක් කපන්නට තිබෙනවා. හැතැප්ම 6ක් කපා, අතුරු ඇලවල් කපා දැන් වැඩ කරන විධියට වැඩ කර මිනිසුන් පදිංචි කරවන්නට ගියොත් තව අවුරුදු 3කින් වත් ඒ වැඩය කරන්නට බැහැ. මැෂින් ආදිය යොදා ඒ ස්ථානය එළි කර හැකි තරම් ඉක්මනින් මේ වැඩය නිම කිරීමට නියෝග කරන ලෙස මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊ ළඟට මා සීනිකම්හල ගැන වචනයක් කියන්නට ඕනෑ. මේ රටේ මහජන මුදල් කාබාසිනියා කරන නොම්මර එකේ සුදු අලියා තමයි, මේ සීනි කම්හල. ඔය සීනි කම්හල නිසා මහජන මුදල් අපතේ යනවා. පුළුවන් නම් මේ සීනි කම්හල සම්පූර්ණයෙන්ම වසා දමා උක් වගා කරන ඉඩ සේවකයන්ට බෙදා දෙන ලෙස මා ඉල්ලා සිටිනව.

**ගරු එම්. එම්. මුස්තාෆා (වැඩ බලන සමාජ සේවා ඇමති)**
*(கௌரவ எம். எம். முஸ்தபா—பதில் சமூக சேவை அமைச்சர்)*
(The Hon. M. M. Mustapha—Acting Minister of Social Services)
I said that in 1965 and you objected to it.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ—அக்குறஸ்ஸ)*
(Dr. S. A. Wickremasinghe—Akuressa)
මද්‍යසාර කම්හල.

**සෙනරත් මයා.**
*(திரு. செனரத்)*
(Mr. Senarath)
මද්‍යසාර බලාපොරොත්තුවෙන් නොවෙයි, ඒක ඇති කළේ. සීනි නිෂ්පාදනය කරන්නයි, ඇති කළේ. දනට උක් වගා කිරීම පිණිස වෙන් කර තිබෙන අක්කර 10,000 ක පමණ මේ බිම් ප්‍රමාණය, ගොවීන්ට දී වී නිෂ්පාදනය කිරීමට කට යුතු කළොත් මේ රට ස්වයම්පෝෂිත කිරීම සඳහා තමුන්නාන්සේලා ගෙන යන ව්‍යාපාරය සාර්ථක වෙනවාට කිසිම අඩමානයක් නැහැ. ඒ අතරම මහජන මුදල් කාබාසිනියා කිරීමත් නවතිනවා.

**ගරු මුස්තාෆා**
*(கௌரவ முஸ்தபா)*
(The Hon. Mustapha)
I agree with you.

**සෙනරත් මයා.**
*(திரு. செனரத்)*
(Mr. Senarath)
I fully agree with my on. Friend the Acting Minister. At that time I objected to his proposal as I wanted to give this institution a trial. It has become a thorough failure. It is a white elephant. It must be scrapped and the land must be given to peasants for paddy cultivation.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනරත් මයා.]

බින්තැන්න පත්තුවේ කොටසක් මා නියෝජනය කරන කොට්ඨාශයටත් ඇතුළත් වෙනවා. එහි තලපිටිඹය නම් තිපුංචි ව්‍යාපාරයක් යටතේ පවුල් 40ක් පමණ පදිංචි කරවා සිටිනවා. මා සුමාන දෙකකට පමණ පෙර ඒ ව්‍යාපාරය බලන්නට ගියා. ඇත්තෙන්ම එය සම්පූර්ණයෙන්ම අසාර්ථකයි. වතුර නැහැ. ගොවිතැන් සියල්ල විනාශ වෙලා. කනගාටුදායක තත්ත්වයකයි ඒ මිනිසුන් ඉන්නේ. ඒ නිසා මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කරන්නට කැමතියි. එතුමා දැන් නාගදීප ව්‍යාපාරය පටන් ගෙන තිබෙනවා. ඒ ව්‍යාපාරයට අඩු ගණනේ මෙතැනින් පවුල් විසිපහක් වත් තෝරාගන්න. සමහර විට ඒ පවුල් හතළිහෙන් පවුල් හතක් අටක් යන්නට කැමති වන එකක් නැහැ.

මීළඟට ගල්ඔය ප්‍රදේශයේ විසි එක් වැනි ජනපදය ගැන සඳහන් කරන්නට ඕනෑ. දැන් ඒ ජනපදයට විශාල වතුර හිඟයක් තිබෙනවා. ඇළට හැතැප්ම පහක් පමණ ඈතිනුයි, ගොවි පවුල් පදිංචි කරවා සිටින්නේ. ඒ පදිංචි වී සිටින තැනට හැතැප්ම හතරක් පහක් ඈතිනුයි, කුඹුරු ඉඩම් තිබෙන්නේ. ඉතින් ඇළ එක පැත්තක; ගෙවල් වෙන පැත්තක; කුඹුරු තව පැත්තක. ක්‍රමවත් සැලැස්මක් නොමැති නිසා මේ මිනිසුන් දැන් ජල ප්‍රශ්නයට මුහුණ පා සිටිනවා. මේ විසිඑක් වැනි ජනපදයට වතුර පයිප්ප ක්‍රමයක් ඇති කළ යුතු යයි දිස්ත්‍රික් කෘෂිකර්ම කාරක සභාවේදී කරන ලද යෝජනාව ඉඩම් කොමසාරිස්තුමාත් අනුමත කර එවා තිබෙනවා. රුපියල් එක් ලක්ෂ තිස් දාහක් යොදවා වතුර පයිප්ප ක්‍රමයක් ඇති කිරීමට සම්මත කර ඇතත් තවම එය ක්‍රියාත්මක වුණේ නැහැ. මුදල් නම් වෙන් කර තිබෙනවා. ඒ නිසා කරුණාකර මේ ප්‍රශ්නය ගැන ඉතාමත්ම ඉක්මනින් කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

වගා නොකළ සමහර ඉඩම් සීනි සංයුක්ත මණ්ඩලයට තිබෙනවා. අක්කර කාල බාගය තරම් වූ මේ ඉඩම්වල, ඒ ආයතනයේ සේවකයන් ගොවිතැන් කරනවා. ඒ සේවකයන් ඒ ඉඩම්වල ගොවිතැන් කරන්නේ වැඩ ඇරී ආවායින් පසුවයි. වැස්ස ලැබෙන මහ කන්නයේදී ඒ සේවකයන් ඒ ඉඩම්වල වී ගහනවා. එහෙත් දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද? සේවකයන් ගොවිතැන් කරන ඒ ඉඩම් අක් කර කාලක ප්‍රමාණයක් සඳහා රුපියල් 25ක් අය කරනවා. මේ අනුව ඉඩම් අක්කරයක් සඳහා රුපියල් සීයක් අය කරනවා. ඒ සේවකයන්ගේ වැටුපෙන්මයි, ඒ මුදල් කපා ගන්නේ. මේක හරිම අසාධාරණ වැඩක්. මේ විධියට බාධා කරන විට වගා ව්‍යාපාරය දියුණු වන්නේ කොහොමද? මා මේ ගැන සීනි සංයුක්ත මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු නිලධාරීන්ට දැනුම් දුන්නා. එහෙත් මගේ කීම තුච්ඡවුවකටවත් ගණන් ගත්තේ නැහැ. ඒ නිසා මේ මිනිසුන්ගෙන් අය කරගෙන තිබෙන මුදල් ආපසු දෙන ලෙසත්, ගොවිතැන් කිරීම සඳහා ඒ මිනිසුන්ට වැඩි වැඩියෙන් ආධාරදෙන ලෙසත් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා මීට වඩා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මා සඳහන් කළ කාරණා ගැන ඇමතිතුමගේත් අනෙකුත් නිලධාරීන්ගේත් අවධානය යොමු වීමෙන් ඒවා නියම ආකාරයට ඉෂ්ට වෙතැයි බලාපොරොත්තු වෙනවා.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**
(මිහින්තලේ)
*(திரு. பீ. எம். கே. தென்னகூன்—மிஹிந்தலை)*
(Mr. P. M. K. Tennekoon—Mihintale)

ගරු සභාපතිතුමනි, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මා නියෝජනය කරන කොට්ඨාශය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ හා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ අවධානය යොමු කරවීමට අවස්ථාව සලසා දීම ගැන මා පළමුකොටම තමුන්නාන්සේට ස්තුති වන්ත වෙනවා. කාලාන්තරයක් තිස්සේ අවශ්‍ය ඉඩම් කච්චේරි නොපැවැත්වීම නිසා ඒ ප්‍රදේශයේ ගොවි මහතුන් තම තමන් අභිමත පරිදි ඉඩම් අල්ලාගෙන ගොවිතැන් කළ බව අප කවුරුනුත් හොඳ හැටි දන්නවා. ඉඩම් කච්චේරි පවත්වා, අල්ලාගෙන තිබෙන මේ ඉඩම් නීත්‍යානුකූල කරන්නැයි ඉල්ලූ අවස්ථාවේදී අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දුන ගන්නට ලැබුණේ, ඉඩම් කච්චේරි කැඩීම සඳහා අවශ්‍ය මිනින්දෝරු මහතුන් නැති කම නිසා ඒ ප්‍රශ්නය පමා වන බවයි. එහෙත් මෑතක සිට, අනවසරයෙන් අල්ලා ගත් ඉඩම් නීත්‍යනුකූල කිරීම සඳහා ඉඩම් කච්චේරි බොහොමයක් පැවැත්වුණා. දැන් ඒ ප්‍රශ්නය තරමක් දුරට හෝ විසඳී තිබීම ගැන මා සන්තෝෂ වෙනවා.

ඒ කෙසේ වෙතත්, 1965 අවුරුද්දේ සැප්තැම්බර් මාසයට පෙර ගොවීන් විසින් අල්ලා ගෙන වගා කරනු ලැබූ ඉඩම්වලට සමහර ප්‍රදේශවල ඔප්පු දී තිබුණත්, විශාල ප්‍රදේශයක ගොවීන්ට, ඔවුන් විසින් අල්ලා ගනු ලැබූ ඉඩම් නීත්‍යනුකූල කිරීම සඳහා ඉඩම් කච්චේරි පවත්වා ඔප්පු දී නැහැ. එම නිසා, ඒ ක්‍රමය යට තේ විහාම ඉඩම් කච්චේරි පවත්වා, ගොවීන් විසින් අල්ලා ගනු ලැබූ ඉඩම් නීත්‍යනුකූල කිරීම සඳහා කටයුතු කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

අ. භා. 4.45

තත්ත්වය එසේ පවතින අතර, මේ රටේ ගොවි ජනතාව කොටස් දෙකකට බෙදෙනවා, නීති විරෝධීව ගොවිතැන් කළ ගොවීන් හා නීතිගරුකව ගොවිතැන් කළ ගොවීන් යනුවෙන්. අත මිට මුදල් තිබුණු, නීතියේ රැහැන ගැන කල්පනා නොකර බලහත්කාරයෙන් ඉඩම් අල්ලා ගෙන ගොවිතැන් කළ පිරිසගේ ප්‍රශ්නය නම් යම්තම්වත් විසඳී තිබෙනවා. එහෙත් නීතියට භය, සාධාරණව ජීවත් වන, බිම් අඟලක්වත් නොලැබූ විශාල ගොවි පිරිසක් අද කරදරයක වැටී සිටිනවා. දැනට ඉතුරු වී තිබෙන රජයේ ඉඩම්, ඉඩම් කච්චේරි පවත්වා, ඉඩම් නැති අයට බෙදා දෙන ලෙස ඉල්ලමින් දිනපතා පෙත්සම් සිය ගණනින් අනුරාධපුර කච්චේරියට ලැබෙන බව, ඒ කච්චේරියට ගිහින් පරීක්ෂා කළොත් පෙනෙයි. 1965 සැප්තැම්බර් මාසයට කලින් බලහත්කාරයෙන් අල්ලා ගත් ඉඩම් නීත්‍යනුකූල තත්ත්වයට පැමිණවීම සඳහා ඉඩම් ඇමතිතුමාගේ නියෝගයට පිටස්තරව, ඉඩම් බෙදා දීම සඳහා වෙනත් වැඩ පිළිවෙළක් නැහැ. එම නිසා දැන් ගොවීන් නැවත වරක් අක්කරය, දෙක, තුන, ආදී වශයෙන් බලහත්කාරයෙන් ඉඩම් අල්ලා ගන්නට පටන් ගෙන තිබෙනවා. ඉඩම් ඇමතිතුමාගේ නියෝගයට පිටස්තරව කටයුතු කරන්නට ඉඩම් නිලධාරීන්ට පුළුවන්කමක් නැති නිසා, එසේ මෑතකදී බලහත්කාරයෙන් ඉඩම් අල්ලා ගත් අයට විරුද්ධව දැන් උසාවියේ නඩු පවරා තිබෙනවා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ඉඩම් කට්ටි 15,789 ක් බෙදා දී තිබෙනවා.

**පී. එම්. කේ. තෙනන්කෝන් මයා.**
*(திரு. பீ. எம். கே. தென்னகூன்)*
(Mr. P. M. K. Tennekoon)

මා නැහැයි කියන්නේ නැහැ. මා කියන්නේ දැන් මතු වී තිබෙන තත්ත්වයයි. 1965 සැප්තැම්බරයෙන් පසු බලහත්කාරයෙන් අල්ලා ගත් ඉඩම්වලට නීත්‍යනුකූල ඔප්පු දීමට තවමත් කටයුතු කර නැහැ. එම නිසා, බලහත්කාරයෙන් කැලෑ එළි කිරීම පිළිබඳ වාර්තා හෙවත් අයි. සී. ආර්. වාර්තා අනුව අද——

**එස්. බී. හේරත් මයා.** (හිරියාල)
*(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)*
(Mr. S. B. Herat—Hiriyala)

1965 ට කලින් ඔප්පු දී තිබෙනවා ද?

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**
*(திரு. பீ. எம். கே. தென்னகூன்)*
(Mr. P. M. K. Tennekoon)

ඒවාට දීගෙන යනවා. [බාධාකිරීම්] මා දැන් සඳහන් කරන්නේ, බලහත්කාරයෙන් අල්ලා ගත් ඉඩම් ගැන නොවෙයි. බෙදා දිය යුතුව තිබුණු ඉඩම් බෙදා දීම සඳහා ඉඩම් කච්චේරි නොපැවැත්වීම නිසා, උසාවිවල රස්තියාදු වන්නට අද ඒ අයට සිදු වී තිබෙනවා. රදාරදාව කියන ගමේ තරුණියකට සිදු වූ හදියක් ගැන, දෙවන වර කියවීමේ විවාදයේදී මා සඳහන් කළා. තම දෙමාපියන් සමග එක පැල්පතේ ජීවත් වන්නට බැරි නිසා ඒ තරුණිය තමාගේ පියාගේ ඉඩම් කෑබැල්ලට යාබද ඉඩමෙන් අක්කර 1/4 ක් අල්ලා ගෙන එහි පැලක් හදා ගත්තා. එහෙත් ඊට විරුද්ධව අයි. සී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]
ආර්. වාර්තා යැවුණා. ඒ අනුව උසාවියේ නඩු පවරා, අර අසරණ තරුණයාට රුපියල් දෙසියයක දඩයක් ගැහුවා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
රක්ෂිත ඉඩමක්ද?

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**
*(திரு. பீ. எம். கே. தென்னகூன்)*
(Mr. P. M. K. Tennekoon)
රක්ෂිත ඉඩමක් නොවෙයි, ආණ්ඩුවේ ඉඩමක්. ඒ වාගේම, ඒ ගමේ තවත් හතර පස් දෙනකුටත් උසාවියේ නඩු පවරා දඩ ගැස්සුවා. ඒ අය නීතිඥයකු අල්ලාගෙන උසාවි ගිය නිසා, රුපියල් 40 ක දඩයකින් බේරුණා. මා අහන්නේ, මේ අහිංසක මිනිසුන්ට මේ විධියට හිරිහැර කරන්නේ ඇයි කියායි.

ඔය ප්‍රශ්නය, එක වරම විසඳන්නට පුළුවන්කම තිබුණා. එක ගමක නීතිවිරෝධිව අල්ලා ගත් ඉඩම් නීත්‍යානුකූල කිරීම සඳහා ඉඩම් කච්චේරි පවත්වන අවස්ථාවේදී අනෙක් අයටත් ඉඩම් බෙදා දුන්නා නම්, ඔය ප්‍රශ්නය එක වරම විසඳන්නට පුළුවන්කම තිබුණා නේද? මීට ඉහත මෙම ගරු සභාවේදී මා කියන්නට යෙදුණු දෙයක් මට දැන් මතක් වෙනවා. එක ගමක් සඳහා හත් අට සැරේ ඉඩම් කච්චේරි පවත්වන්නේ නැතුව නීති විරෝධිව අල්ලා ගත් ඉඩම් නීත්‍යානුකූල ඉඩම් හැටියට පවරා දෙන විටම අනිකුත් උදවියට අවශ්‍ය ඉඩම්ද බෙදා දෙන්නැයි මා එදා කියා සිටියා. එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවූ නිසයි, අද අපේ රටේ ගැමි ජනතාවට වැරදිකාරයන් වශයෙන් උසාවිය ඉදිරිපිටට යන්නට සිදු වී තිබෙන්නේ.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
මේ පිළිබඳව වචනයක් කියන්නට කැමතියි. සාමාන්‍යයෙන් ගම්වල ගොඩ ඉඩම්, අවශ්‍යතාවය අනුව බෙදා දීමේ ප්‍රතිපත්තිය ක්‍රියාවට යොදවන්නේ එම ප්‍රදේශයේ දිසාපති වරයායි. ප්‍රදේශයේ දිස්ත්‍රික් සම්බන්ධීකරන කාරක සභාවේදී ඒකමතිකව තීරණයක් ගත් විට එම ක්‍රියාව කෙරෙනවා. ඒ හැර මෙය අමාත්‍යාංශයෙන් කළයුතු දෙයක් නොවෙයි.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**
*(திரு. பீ. எம். கே. தென்னகூன்)*
(Mr. P. M. K. Tennekoon)
අද ඉඩම් කච්චේරි පවත්වන්නේ බල හත්කාරයෙන් අල්ලා ගත් ඉඩම් සඳහා පමණයි. සාධාරණ පිළිවෙළට ඉඩම් ඉල්ලා සිටි අය සඳහා කවදාවත් ඉඩම් කච්චේරි පවත්වන්නේ නැහැ. එම අසාධාරණය ගැනයි, මා මේ කියා සිටින්නේ. දිසාපතිවරයාගෙන් හෝ ඉඩම් නිලධාරීන්ගෙන් හෝ මෙම වැඩ පිළිවෙළ නිසිසේ ක්‍රියාත්මක නොවෙනවා නම් එය ඇවිත් කිව යුත්තේ මෙම සභාව ඉදිරිපිටදීයි. එම නිසා එක පැත්තකින් ගොවිතැන් කිරීම සඳහාත් අනික් පැත්තෙන් පදිංචිය සඳහාත් දුප්පතුන්ට ඉඩම් අවශ්‍ය වූ විට ඉඩම් කච්චේරි පවත්වා ඒ උදවියට එම ඉඩම් බෙදා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා. ග්‍රාම සේවක මහතකු නැත්නම් ඉඩම් ඕවර්සියර් මහතකු මාර්ගයෙන් අයි. සී. ආර්. එකක් ගිය පමණින්ම ඒ උදවිය උසාවියට ගෙන්වා හිරිහැර කරන්නට එපායැයි මා ඉල්ලා සිටිනවා. ඒ ඒ ගම්වලින් ලැබෙන වාර්තාවලට අනුව ඒ ඒ ගම්වල විශේෂ ඉඩම් කච්චේරි පවත්වා එම ඉඩම් නිත්‍ය නීත්‍යානුකූලව බෙදා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේලා එක් වරක් ගොස් මහකනදරාව ගොවි ජනපදය පරීක්ෂා කර ආවා. එහි විශාල වශයෙන් ගොවීන් පදිංචි කර සිටිනවා. එහෙත් ඒ උදවියට සෞඛ්‍ය පහසුකම් ඇත්තේ නැහැ. රෝගයක් ඇති වූ විට මිහින්තලේ ආරෝග්‍ය ශාලාව කරා එන්නට සිදු වෙනවා. එම ආරෝග්‍ය ශාලාව තිබෙන්නේ ඔවුන් වෙසෙන ජනපදයෙන් පිටතයි. එය අවුරුදු 100කටත් වඩා පැරණියයි කිවහැකි ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවක්. එහි අවශ්‍ය පමණ ගොඩනැගිලි ඇත්තේ නැහැ. වෛද්‍ය පහසුකම් ඇත්තේ නැහැ. ඉඩම් අමාත්‍යාංශය යටතේ ඇති අනිකුත් ජනපදවලට අංග සම්පූර්ණ ආරෝග්‍ය ශාලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා. අවාසනාවකට වාගේ මේ වන තුරු මිහින්තලේ මහකනදරාව ගොවි ජනපදයට අංග සම්පූර්ණ ආරෝග්‍ය ශාලාවක් ලැබී නැහැ. මෙම තත්ත්වය නිසා එහි ජනතාව බොහෝසෙයින් දුක් විඳිනවා. ඉපැරණි මිහින්තලේ ආරෝග්‍ය ශාලාවෙන් තමයි ඔවුන්ට යන්තමකින්වත් ප්‍රයෝජනයක් ලැබෙන්නේ. එයත් නැතිනම් ඔවුන් අනුරාධපුරයේ ආරෝග්‍ය ශාලාවට එන්නට ඕනෑ. ඒ සඳහා සැතපුම් 10ක් 12ක් ගමන් කරන්නට සිදු වෙනවා. ගොවි ජනපදවල වෙසෙන උදවියට අවශ්‍ය පමණට වෛද්‍ය පහසුකම් සලසා දීමටත් අනිකුත් වුවමනාවන් ඉටු කර දීමටත් අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා හැටියට මා ඉතා ආදරයෙන් ඉල්ලා සිටිනවා. මහකනදරාව යුනිට් 5 ගොවි ජනපදයේ දැන් ජනතාව පදිංචි කර අවසානයි. එහි වැඩි වශයෙන් සිටින්නේ පිටින් තෝරා ගත් අයයි. තවම ඒ උදවිය ඒවායේ පදිංචිය ස්ථිර කරගෙන නැති හෙයින් මේ දක්වාත් ඔවුන් තමන්ගේ ගම්වල වෙසෙන උදවිය සමග සම්බන්ධකම් පවත්වාගෙන යනවා. ඒ උදවියගේ ගේදොරවල වෙසෙන අය ගෙන් යම්කිසි කෙනෙකුට හදිසියක් වුව හොත් ඒ ගැන දැනගන්නට තැපැල් පහසුකම් ඇත්තේ නැහැ. අඩු වශයෙන් විදුලි පණිවුඩයක් ලබා ගැනීමට වුවත් දින තුන හතරක් ගත වෙනවා. රඹෑව උප තැපැල් කාර්යාලයට අයත් ලියුම් බෙදීමේ සීමාවෙන් පිටස්තරව පිහිටි නිසා යුනිට් 5 කොට්ඨාශයට ලියුම් බෙදන්නේ නැහැ. ඊයේ පෙරේදා මට ලැබුණු පැමිණිල්ලක් අනුව මා රඹෑව තැපැල් කාර්යාලයට දැනුම් දුන්නා මේ කාරණය ගැන. අඩු වශයෙන් ඒ ලියුම් එම ප්‍රදේශයේ පිහිටි පාඨශාලාවටවත් ගෙන ගොස් භාර දෙන්නැයි මා කියා සිටියා. එහෙත් ඒ ලියුම් පිළිබඳ වග කීම තැපැල් මහතා භාර ගන්නවා නම් පමණයි එසේ කරන්නට පුළුවන්කම ලැබෙන්නේ. වගකීමෙන් තොරව එම ලියුම් භාර ගන්නට පාඨශාලාචාර්යතුමා සූදානම් නැහැ. ඒවාට වග කියන්නටත් එතුමා කැමති නැහැ. එසේ හෙයින් මේ යුනිට් 5 කොට්ඨාශයට උප තැපැල් කාර්යාලයක් ඇති කර එම ප්‍රදේශයේ වෙසෙන මහජනතාවට සහනයක් සලසා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ජනපදවල පිහිටි පාරවල් ගැන කියන්නට කැමතියි. මහකනදරාව ප්‍රදේශයේ පමණක් නොවෙයි හුරුලුවැව ප්‍රදේශයේ පවා ජනපද පාරවල් අබලන් වෙලයි තියෙන්නේ. ඊට හේතුවක් තිබෙනවා. මෙම පාරවල් ගම්සභාවට අයිතිත් නැහැ. මේවා සංවර්ධනය කළයුත්තේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙනුයි. ඉඩම් ඇමතිතුමාගේ මූලිකත්වය ඇතුව ජනපද පාරවල් පිළිබඳව පවත්වන ලද සාකච්ඡාවේ දී තීන්දු කළා එම පාරවල් ගම්සභාවට පවරා දී ඒවායේ නඩත්තුවට අවශ්‍ය මුදල් ලබා දිය යුතුය කියා. ඒ ගැන තීන්දුවක් ගන්නවාය කියා එදා ඇමතිතුමා කිව්වා. නමුත් අද වන තුරු තීන්දුවක් අරගෙන නැහැ. එමනිසා ජනපද තුළට යන පාරවල් අද ඉතාම අබලන් තත්ත්වයකින් තිබෙනවා. ප්‍රධාන මාර්ගයට එන්නට අද සැතපුම් හත අට පයින් ගමන් කළයුතුව තිබෙනවා. එමනිසා ඒ පාරවල් අළුත්වැඩියා කිරීම පිළිබඳව ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළයුතු බව මා කියන්නට සතුටුයි. මේ පාරවල් ගම් කාර්ය සභාවලට දෙනවා නම් අප ඒවා භාර ගන්නට ලෑස්ති බව ගම් කාර්ය සභා සභාපතිවරයකු වශයෙන් මා කියන්නට සතුටුයි. නමුත් ඒ සමගම තවත් වචනයක් කිව යුතුව තිබෙනවා. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අපට සීමිත මුදලක් ලැබෙන්නෙ. දැනට දියුණු කර තිබෙන පාරවල නඩත්තුවට පමණයි ඒ මුදල ප්‍රමාණවත් වෙන්නෙ. සෑහෙන මුදලක් නැතිව ගොවි ජනපදවලට යන විශාල පාරවල් භාරගෙන අපට නඩත්තු කරන්නට බැහැ. එම නිසා එක්කෝ කෙලින්ම මේ පාරවල් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හදිගස්සා දෙන්න. එහෙම බැරි නම් එක්තරා ආධාර මුදලකුත් සමග මේ පාරවල් පළාත් පාලන ආයතනවලට පවරා දෙන්න.

සාලියපුර-මානියන්කඩවල පාර ගැන අපේ ප්‍රවාහණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාත් දන්නවා. ඒ මාර්ගයේ අද බස් රථයක් ධාවනය කරනවා. නමුත් ඒ පාරේ බස් රථයකින් යන්නට තබා පයින් යන්නටවත් බැරි තත්ත්වයක් අද තිබෙන්නෙ. ඒ තරමට අබලන් වී තිබෙනවා. මේ පාර බස් රථ ධාවනයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

සුදුසු පරිද්දෙන් සකස් කර දෙන්නය කියා මා අවුරුදු ගණනාවක් තිස්සේ ඉල්ලීම් කරනවා. ඒවාගේම මට මතකයි ගරු ඇමතිතුමා අනුරාධපුරයට පැමිණි අවස්ථාවකදී එවෙලෙම කඩදාසි කෑල්ලක් ගෙන වහාම මේ පාරට ගල් දමා තාර දමා දෙන්නය කියා නියෝගයක් කළ බව. ඊයේ පෙරේදා මා එහි යන විට කම්කරුවන් ඒ පාරේ වළවල්වලට පස් දමා තළනවා මා දුටුවා. එක වර්ෂාවක් වැස්ස හැටියේම ඒ පස් දියවී යනවා. නැවතත් බස් රථය ධාවනය කරවන්නට බැරි තත්ත්වයක් ඇති වෙනවා. එමනිසා මේ පාර සාදා දෙන මෙන් මා කාරුණිකව ඉල්ලීමක් කරනව. මධ්‍යම පන්තියේ ජනතාවත් ඒ වාගේම දුප්පත් ජනතාවත් පදිංචිව සිටින ජනපදයක් ඔස්සේ යන පාරක් මේක. මේ පාරේ ධාවනය වන බස් රථයෙන් තමයි ඒ ජනපදවාසීන් ප්‍රධාන නගරයට එන්නෙ. ඒවාගේම ප්‍රදේශයේ ළමුන් උසස් අධ්‍යාපනය සඳහා අනුරාධපුරයේ මහා විද්‍යාලවලට එන්නේත් මේ බස් රථයෙනුයි. දැනට ඉතාම අබලන් තත්ත්වයක මේ පාර තිබෙන නිසා සමහර අවස්ථාවලද බස් රථය ධාවනය කරවන්නේ නැහැ. එහෙම එක දිනක් බස් රථය නැතිවුණොත් විශේෂයෙන්ම උසස් අධ්‍යාපනය ලබන දරුවන්ට විශාල පාඩුවක් වෙනවා. එමනිසා ගල් දමා තාර දමා මේ පාර බස් රථ ධාවනයට සුදුසු පරිද්දෙන් ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් මා නැවතත් ඉල්ලා සිටිනවා.

ඊළඟට සේනපුර ජනපදවාසීන් ගැන මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා. සේනපුර ජනපදය අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැරණිම ජනපදවලින් එකක්. කලා වැවේ වාන ඉස්සීමෙන් ඉඩම් නැතිව ගිය ජනතාව සඳහායි මේ සේනපුර ජනපදය ආරම්භ කළේ. නමුත් මේ දක්වා සේනපුර ජනපදවාසීන්ට ඒ ඉඩම් නීත්‍යානුකූලව පවරා දී නැහැ. ඒ ඉඩම් නීත්‍යානුකූලව පවරා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

තවත් කාරණයක් තිබෙනවා. සේනපුර ජනපදයේ ගොවීන් තම තමන්ගේ කුඹුරුවලම ගෙවල් සාදාගෙන පදිංචි වී සිටිනවා. එය සෞඛ්‍යයට අහිතකරය කියා මා කල්පනා කරනවා. මේ කාරණය ගැන මා කලිනුත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර තිබෙනවා. ඒ සෑම ජනපදවැසියකුටම ගෙයක් සාදා ගැනීම සඳහා වෙනත් ගොඩ ඉඩම් කෑබැල්ලක් වෙන් කර දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. මේ කාරණය සම්බන්ධව අද වනතුරු කිසිවක් කර නැහැ. ඒ ගැන මා කණගාටු වෙනවා.

තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ජනගහණය වැඩිවීම නිසා සේනපුර ජනපදයේ පාඨශාලා ගොඩනැගිලි දැන් ප්‍රමාණවත් නැහැ. එමනිසා සේනපුර ජනපදයේ දරුවන්ට අද ගස් යට අධ්‍යාපනය ලබන්නට සිද්ධ වී තිබෙනවා. මේ තත්ත්වය කලා වැව ගරු මන්ත්‍රීතුමාත් (රත්නමලල මයා.) දන්නවා. ඒ තරම් තදබද තත්ත්වයක් දැන් පවතින්නෙ. ඉඩකඩ කොහෙත්ම ප්‍රමාණවත් නැහැ. අනික් ජනපදවල නම් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් අළුත් පාඨශාලා ගොඩනැගිලි සාදා තිබෙනවා. නමුත් සේනපුර ජනපදයේ පාඨශාලා ගොඩනැගිලි ඉදි කර දෙන්නය කියා ඉල්ලූ අවස්ථාවේදී ඇමතිතුමා ක්‍රියා නොකිරීම ගැන අප කණගාටු වෙනවා.

තවත් ප්‍රශ්නයක් තිබෙනවා. සේනපුර මාතෘ නිවාසයට යාබදව පිරිමි රෝගීන් සඳහා වාට්ටුවක් සාදා දෙන්නය කියා අප ඉල්ලීමක් කළා. දැන් අවුරුදු පහක් තිස්සේ අප ඒ ඉල්ලීම කරනවා. ඒ අනුව දැනට වැඩ කරගෙන යනවා. කොන්ත්‍රාත් එක දී තිබෙනවාය කියා ආරංචියි. ඒ කාර්යය අවසාන වන්නේ කවදාද කියා මා දැනගන්නට සතුටුයි. වරක් ටෙන්ඩර් කැඳෙව්වා. ඒ අවස්ථාවේදී ඇස්තමේන්තු දුර්වල නිසා පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් ඉල්ලන්නට මැළිවුණාය කියා අපට දැනගන්නට ලැබුණා. ඊටපසු දැන් ඇමතිතුමාගේ මිත්‍රයකු වන ඇහැලේපොල මහත්මයා ඒ කොන්ත්‍රාත්තුව අරගෙන වැඩ කරගෙන යනවා. එය කවදා අවසාන් කරන්නට බලාපොරොත්තු වෙනවාද කියා මා දැනගන්නට සතුටුයි. පුළුවන් තරම් ඉක්මණින් ඒ කටයුත්ත අවසාන කර දුන්නොත් විශාල යහපතක් අත් වෙනවා. ගිය අවුරුද්දේත් මා මේ කරුණු ඉදිරිපත් කළා. නමුත් ඉෂ්ට නොවූ නිසයි මා නැවතත් මේ කරුණු ගැන මතක් කළේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එයින් වැඩක් නුවූ නිසයි නැවත මතක් කරන්නට සිදු වුණේ. අද මා කී හරියම නැවත වරක් කියන්නට ඉඩක් නොතබා ඒවා අපට සම්පූර්ණ කරදෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 5

**පී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු සභාපතිතුමනි, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මා ඉතාමත් කැමැත්තෙන් සිටිනවා. වත්තේගම ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී වැදගත් කාරණයක් සඳහන් කළා. ගරු ඉඩම් ඇමතිතුමාගේ ව්‍යාපාර යත් සේවයත් ගරු ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ සහ ගරු ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ ව්‍යාපාර අනුවම කරගෙන යන දේවල් බව ඒ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ඇත්ත වශයෙන්ම ඒක එහෙමම තමයි යන්න අපට පිළිගන්නට පුළුවනි. 1931 අවුරුද්දේ සිට ගොවිකර්මාන්තය භාර ඇමතිවරයා වශයෙන් මේ රටේ වැඩ කළ ඩී. එස්. සේනානායක මැතිතුමා එවකට කරගෙන ගිය වැඩ කට යුතු ඒ කාලයේ හැටියට වැරදියි කියන කථාවක් කවුරු කිව්වත් කිසිම කෙනෙක් භාර ගත්තේ නැහැ.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)

ඒ කාලේ වැරදියි කිව්වා.

**පී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

කියාපු අය ඇති. අපි එහෙම කථාවක් කිව්වේ නැහැ.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)

තමුසේ ඒ කාලයේ සිටියෙත් නැහැ.

**පී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

හැබෑ නේන්නම්. ඒ කාලේ හැබෑටම ප්‍රවාහණ ඇමතිතුමා නම් ඉන්නට ඇති. එහෙම නම් එතුමා ඒ විධියට ඒ කාලයේ කියන්නටත් ඇති. මම නම් ඒ කාලේ හිටපු බව මම දන්නවා. හැබැයි, මම නම් ගරු ඩී. එස්. සේනානායක මැතිතුමා ඒ කාලේ කළ වැඩ නරක දේවල්ය කිව්වේ නැහැ. අපි ඒවා හොඳයි කියලා නම් කිව්වා. ඒ කාලේ හැටියට එතුමා කළ වැඩ අගෙයි. ඒ කාලේ හැටි අපි දන්නවා නොවැ. ඒ කාලේ හැටියට අධිරාජ්‍යවාදීන්ගේ බැම්මලින් අත්මිදී සාමාන්‍ය බලයක් හෝ ලංකාවේ ජනතාවට ලැබුණු අවස්ථාවේදී ඒ ගැන ඔය රටේ මහත්තැන්ලා වාගේ උදවිය එහෙම නම් විරුද්ධ වුණා තමයි. අපි නම් විරුද්ධ වුණේ නැහැ.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)

ඔය පැත්ත නොවෙයිද, විරුද්ධ වුණේ ?

**පී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

අපේ කවුරුවත් ඔය රටේ මහත්තැන්කමක් කරලත් නැහැ, කරන්නේත් නැහැ. ඒ නිසා මම කියන්නට කැමතියි, එහෙම උදවිය කොහොම විරුද්ධව මොනවා කිව්වත් අපි නම් විරුද්ධ වුණේ නැති බව.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)

ආරච්චි මහත්තුරු ?

**පී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

අපේ කවුරුවත් ඔය ආරච්චිකමක් තියා කලව්ටි කංකානම්කමක්වත් කරලා නැහැ, ඒ කාලේ. ඒ කාලේ ඉංගිරිසීන් යටතේ විතරක් නොවෙයි, පෘතුගීසීන් යටතේවත්, ඕලන්දක්කාරයින් යටතේවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]
එවැනි දෙයක් කරලා නැහැ, අපේ කවරුවත්. අපේ කවුරුවත් පරදේසක් කාරයන් යටතේ ඔය කියන එකම එක ඝානාන්තරයක්වත් නොකළ බව ආඩම් බරයෙන් කියන්නට කැමතියි. අපේ පරම් පරාවේ කිසිම කෙනෙක් පරදේසක් කාරයන් යටතේ කලවිටි කංකානම්කමක් වත් නොකළ බව ආඩම්බරයෙන් කියන් නට කැමතියි.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)
මහවලතැන්නෙලා කව්ද ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
එහෙම නම් ඔය ප්‍රවාහණ ඇමතිතුමාටත් ඒවාට සම්බන්ධකම් තිබෙනවා වෙන්නට ඇති. හැබැයි, අපට නම් ළඟකින්වත් ගැවිලාවත් නැහැ එහෙම කෙනෙක්. දේශ පාලනය පටන් ගන්නා කාලේ ඉඳලාම රදල ක්‍රමයට විරුද්ධවයි මා වැඩ කෙළේ. රදල ක්‍රමය අනුගමනය කරන අය මට්ටම් කිරීම පිණිස තමයි අපේ මුළු ජීවිත කාලයම ගත කර තිබෙන්නේ. ඒ කාරණය ඉතාමත් ප්‍රීතියෙන් ප්‍රකාශ කරන්නට මම කැමතියි.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)
තමන්ගේ නායිකාව මට්ටම් කරන්නට බැරි වුණා නොවැ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
අපේ නායිකාව රදල ක්‍රමය අනුගමනය කරන කෙනෙක් නොවෙයි. ඒ පැත්ත බැලුවත් මේ පැත්ත බැලුවත් රදල පරම් පරාවලට අයිති කෙනෙක් තමයි. ඒක වෙන්නට පුළුවනි. රදල පරම්පරාවලට නිකම් නම් ගාවාගත් කෙනෙක් නොවෙයි අපේ නායකතුමිය. නිකම් නම් ගාවාගත් උදවිය ගැන ඕනෑ නම් ඕනෑ තරම් තොරතුරු කියන්නට මට පුළුවනි. අපේ රටේ හුඟක් දෙනා තමන් රදලයින්ය කියා ගන්නවා. ඒක අපි දන්නවා. ඒ පරම්පරාවල විත්තිය දිග හරින්නට හුඟක් වෙලාව තියෙනවා නම් පුළුවනි. [බාධා කිරීමක්.] දිග හැරියොත් ඉතිරි වන්නේ වලිගේ පමණක් බව මතක් කරන්නට කැමතියි. ඒ නිසා කොයි මිනිසුන්වත් තම තමන්ගේ ඉතිරි කර ගෙන තිබෙන පට්ටම් ටික එහෙමම වුවමනා නම් තියා ගන්නවා මිස නිකම් ඇවිත් ගලවා ගන්නට එපායයි මේ අවසථාවේ හැටියට කියන්නට මම කැමතියි.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)
අපට පට්ටම් ඉතිරිවෙලා නැහැ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ඩී. එස්. සේනානායක මැතිතුමාගේ කාලයේදී වනගත ප්‍රදේශවලට යන්නට කැමති උදවිය සැහෙන පිරිසක් හිටියේ නැහැ. වනාන්තරයේ කවුරුවත් නොගිය තැන්වලට ගිහිල්ලා, ඒවා බලයෙන් වාගේ මිනිසුන්ට ලබා දී වාරිමාර්ග දියුණු කර ඒ කාලයේ හැටියට එතුමා වැඩ කළ බව අපි දන්නවා. ඒ කාලේ කවුරුවත් යන්නට කැමති වුණේ නැතත් අද කිසිවෙක් කිසිම කෙනකු බලයෙන් යවන්නට වුවමනාවක් නැහැ. අදත් ඒ වගේ ඉඩම් දෙනව නම් මිනිසුන් දහස් ගණන් ලක්ෂ ගණන් ලංකාවේ ඕනෑම තැනකට යන්න ලැහැස්තිව සිටිනව. එදා 1931 කවුරුවත් කැමැත්තෙන් ගියේ නැහැ. බොහොම අමාරුවෙන් තමයි ගොවීන් ටිකක් ගෙන ගිහින් පදිංචි කෙරෙව්වෙ. එහෙම පදිංචි කළ උදවියගෙන් සමහරු නැවතත් ඔවුන්ගෙ ගම් ප්‍රදේශවලට ඇවිත් පදිංචි වුණා. එදා ඩී. එස්. සේනානායක අගමැති තුමා ගොවිකම් ඇමති වශයෙන් ගෙන ගිය ව්‍යාපාරය ඉතා ප්‍රශංසනීයයි, හොඳයි.

අපේ වර්තමාන අගමැතිතුමාත් අවුරුදු 15 කට, 20 කට පසුව රටේ ඇති වූ වෙනස් වීම් අනුව කටයුතු නොකර පියා කළ දේම කරගෙන ගියා නම්, ඒක හරි යයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපට භාර ගන්නට පුළුවන්කමක් නැහැ. ඒ වගේම ඊට අවුරුදු 40 කට විතර පසුව වර්තමාන ඇමතිතුමාත් කියනව නම්, "මම කරන්නේත් ඒකමයි" කියා අපට ඒක හරි යයි භාර ගන්නටත් බැහැ. ලෝකයේ එදිනෙදා සිදුවන වෙනස්වීම් කල්පනාවට ගෙන දියුණුව කරා ගමන් කළ යුතු නම් අපට කොයි අන්දමින්වත් ඒ විධියේ වැඩ පිළිවෙලවල් හරි යයි භාර ගන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපේ රටේ අද තිබෙන තත්ත්වය ගැන කල්පනා කර හරිහැටි ඉඩම් සහ වාරිමාර්ග කටයුතු ක්‍රියාත්මක කිරීමට විධිවිධාන යොදන්න ඕනෑ. අද එසේ සිදු නොවන බව කණගාටුවෙන් මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ ගම්වල දැන් ඉඩම් ප්‍රශ්නයක් නැහැ. අපේ වියළි කලාපයේ අද ඉඩම් ප්‍රශ්නයක් නැහැ. අපට තිබෙන්නෙ වතුර ප්‍රශ්නයයි. අපේ පළාතෙ ජල පහසුකම් තිබෙන ඉඩම් කට්ටි 10 ක් බෙදා දීම සඳහා ඉඩම් කච්චේරියක් පවත්වනවා යයි දැන්වීමක් ප්‍රසිද්ධ කළොත් අපේ ප්‍රදේශයේ දහස් ගණනක් ඒ සඳහා ඉල්ලුම් කරයි. ජනපද ව්‍යාපාර යටතේ බෙදා දෙන ඉඩම් ගැන දැන් හැම දෙනාම බලාපොරොත්තු වෙනව. යන්තමින් හෝ වියළි කලාපයේ ජීවත් වන්ට පුළුවන්කම තිබෙන්නෙ—හරිහැටි ජීවත් වන්ට බැරි වුණත්—ජනපද ක්‍රම යටතේ බෙදා දෙන ඉඩම් කට්ටිවල පමණයි කියන විශ්වාසය තරමක් දුරට අපට පිළිගන්ට සිදු වී තිබෙනව.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පරාක්‍රම සමුද්‍රය යටතේ සහ මින්නේරියේ ගිරිතලේ ව්‍යාපාරය යටතේ ජීවත්වන ගොවීන්ට සාමාන්‍යයෙන් ගොවීන් වශයෙන් ජීවත් වන්ට තරම් ආදායමක් ලැබෙන බව අපි දන්නව. එහෙත් හුරුල්ල, කණ්ඩලම හා දේවහුව ව්‍යාපාර යටතේ පදිංචිව සිටින උදවිය ඉතා දුඃඛිත තත්ත්වයකයි, පසුවන්නෙ. කණ්ඩලම හා දේවහුව ව්‍යාපාර යටතේ ගොවීන් පදිංචි කරවල දැන් අවුරුදු 17 ක්, 18 ක් තරම වෙනව. ගරු සභාපතිතුමනි, දේවහුව සහ කණ්ඩලම ජනපදවල ඉඩම් බෙදා දුන්නෙ ළමයින් 11 දෙනකු හෝ ඊට වඩා සිටින පවුල්වලටයි. දරුවන් 11 දෙනෙකුට වැඩියෙන් සිටින උදවියට ඒ ඉඩම් දෙන බව කියමින් ගම්වලින් ඒ ව්‍යාපාරවල පදිංචි කරවීම සඳහා ගොවීන් තෝරා ගත්ත. අද ඒ ජනපදවල තත්ත්වය මොකක්ද? වතුර ප්‍රශ්නය අදත් එදා තිබුණු තත්ත්වයේමයි. දේවහුවෙ නම් එක කන්නයක් වත් වැඩ කර ගන්ට වතුර නැහැ. කණ්ඩලමෙ යන්තමින් එක කන්නයක් වැඩ කර ගන්ට පුළුවනි.

මෙම ජනපදවල පදිංචියට ගිය උදවියගෙ දරුවන් හතර-පස් දෙනා දැන් විවාහ වෙලා ඒ ඉඩම්වල වෙන වෙනම ගෙවල් සාදාගෙන ජීවත් වෙනව. මුලින් දහ-දෙළොස් දෙනා වශයෙන් ගිය පවුල් දැන් තිහ-හතළිහ වෙලයි, තිබෙන්නෙ. මේ නිසා පවුල් වශයෙනුත් ඉතා අමාරු තත්ත්වයකයි, අද ඔවුන් ජීවත් වෙන්නෙ. මේ ගොවීන්ට වතුර නැහැ. මේ ආණ්ඩුව ගොවීන්ට නොයෙකුත් අන්දමේ උදව් කරනවාය කියා නිතරම කියනවා. එහෙත් මොනවාද කරන උදව් කියා මා අහනවා. ඉස්පිරිතාල නැතත්, පාරවල් නැතත්, අඩු වශයෙන් ඉඩම් ටිකත් වතුර ටිකත් මේ ගොවීන්ට ලබා දෙනවා නම් ඒ ඇති. ඉඩනුයි වතුරයි නොමිලේ ලබා දෙන්න. මේ ගොවීන්ගේ ඇතැම් කන්නවල් පාළු වූ බව අපි දන්නවා. එහෙත් ගොවීන්ගෙන් ගන්න ඉඩම් බද්ද හා වතුර බද්ද දිගටම ගන්නවා. කණ්ඩලම හා දේවහුව ජනපදවල ගොවීන්ට දන්වා යවා තිබෙනවා ඉඩම් බද්ද හා ජල බද්ද නොගෙව්වොත් එළියට දමනවාය කියා. ඒ නිසා මේ රජය ගොවීන්ට ආධාර කරනවා නම්, ගොවීන්ගෙන් මේ රටට අවශ්‍ය කරන ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනයක් බලාපොරොත්තු වෙනවා නම්, එමෙන්ම ඔවුන්ට සැලකීමට අපි ලැහැස්ති නම්, මේ රටේ ජීව රුධිරය ගොවීන් යයි අපි භාර ගන්නවා නම්, එවැනි වූ ඒ ගොවීන්ගෙන් ඉඩම් බද්ද හා ජල බද්ද ගැනීම සම්පූර්ණයෙන් අතහැර දමා එයින් යම් පාඩුවක් වෙනවා නම් ඒ පාඩුව වෙන යම් මාර්ගයකින් මකා ගෙන ඔවුන්ට ඒ සහනය සලසා දෙන ලෙස ගරු ඇමතිතුමා දැන් මෙහි නැති නිසා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, දේවහුව ජනපදයේ ළිං සඳහා සෑම ගොවියකුටම අක්කර ½ ක් වෙන් කිරීමේදී ළිඳක් සාදාගැනීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

මුදලක් දෙන බව අනුරාධපුර කච්චේරි යෙන් මේ ළඟදී දැනුම් දී තිබුණා. ළිඳක් සාදාගැනීමට අවසර දෙනවාය කියා කච්චේරියෙන් කියා ඇති නමුත්, ඉඩම් බද්දෙන් හා දිය බද්දෙන් සම්පූර්ණයෙන්ම නිදහස් නැති අයට—ඉඩම් බද්ද හා ජල බද්ද සම්පූර්ණයෙන් ගෙවා නැති අයට--ළිඳක් සාදාගැනීමට ඉඩ දීමට කොහෙත්ම ලැහැස්ති නැතෙයි කියා අනුරාධපුර කච්චේරිය කියනවා. ඒ නිසා මේ ඉඩම් බද්ද හා ජල බද්දෙන් එම ජනපදවාසීන් නිදහස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ ජනපද අවුරුදු 15 ක් හෝ 20 ක් පැරණි නමුත් තවමත් හරියාකාර ඇළවල් කපා ඉවර නැහැ. අදත් ජනපදවාසීන්ට තමන්ගේ ගෙවල්වලට යන්න හරියාකාර පාරක් තොටක් නැහැ. සෑම අවුරුද්දක් පාසාමත් අපි කියා සිටිනවා මේ ජනපද වාසීන්ට හරියාකාර පාරක් තොටක්වත් හදා දෙන්නය කියා.

ගරු සභාපතිතුමනි, යක්කුරාගල ජනපදය කියා එකක් තිබෙනවා. එයට ඇතුළු වන පාලම කැඩී දැන් අවුරුදු 3 ක් පමණ වෙනවා. එහෙත් තවමත් ඒ ගැන කිසිවක් කර නැහැ. මා හිතන විධියට ඒ ගැන මා ටෙලිග්‍රෑම් සියයකටත් වඩා එවා ඇති ලියුම් විශාල සංඛ්‍යාවක් එවා ඇති. ඇමතිතුමාටත් එවා ඇති; දිසාපතිතුමාටත් එවා ඇති. එහෙත් මේ දක්වාම කිසිවක් කර නැහැ. එමෙන්ම පහසු ක්‍රමයේ ඉඩම් දී තිබෙන ප්‍රදේශවලට හැතැප්මය හමාර වනය මැදින් කඳු හෙල් පසු කරගෙන යන්නට ඕනෑ. පාරවල් නැහැ. එමෙන්ම සැඳන්ගමුව කියා පාරක් තිබෙනවා. එය දියුණු කරන ලෙස අපේ ආණ්ඩුව කාලයේ සිටම මා ඉල්ලා තිබෙනවා. ඒ ගැනත් මේ දක්වාම කිසිවක් කර නැහැ.

ගරු සභාපතිතුමනි, වැවල වැව නමින් සීගිරිය ළඟ වැවක් බැඳගෙන යනවා. එහි 120 කට පමණ ඉඩම් කට්ටි දෙන්නට යනවා. අපේ ප්‍රදේශය කිට්ටුව අලකොළ වැව හා නිකවටවන වැව නමින් වැව් දෙකක් තිබෙනවා. අවට ගම්වල මිනිසුන් සියලුදෙනාම මේ වැව් අවට ඇති ඉඩම් කට්ටි බලාපොරොත්තු වෙන් සිටිනවා. වැව් අවට සිටින ජනතාව බඩගින්නේ සිටියදී පිටින් පැමිණෙන අයට එම ඉඩම් දීම යුතු නැති බව, මාතලේ දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභා රැස්වීමකදී මා කියා සිටියා. එහෙත් මාතලේ දිස්ත්‍රික්කයෙන්ම මෙම 120 දෙනා බඳවා ගන්නට ඕනෑ යයි දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාව තීන්දු කළා. ඒ තීරණය අනුව, එක් ගමකින් එක් කෙනකු බැගින්වත් ගන්නට සෑහෙන ඉඩම් ප්‍රමාණයක් මේ ස්ථානයෙහි ඇත්තේ නැහැ. තමන්ට කොපමණ ඉඩම් තිබුණත්, පහසුවෙන් වතුර ලැබෙන තැනක ඉඩමක් ලබා ගන්නට පුළුවන් කමක් තිබෙනවා නම් ඒ සඳහා අද හැම කෙනකුම ඉදිරිපත් වෙනවා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

වැවල වැවේ තිබෙන්නේ අක්කර 150 යි. ඒක ජනපදයක්ද? ගම්මුන්ගේ ව්‍යාපාරයක්ද?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

වැව යටතේ ජනපදයක්. වැවට ඉතාම කිට්ටුව සිටින, කුඹුරු නැති, ඉඩම් නැති ගොවීන්ට වැවල වැව යටතේ ඉඩම් ලබා දීම හොඳයි. මහ සීගිරිවැව, මානිත්ගමු මහ වැව, මහාගෝන වැව, නවත් කුඹුර මහවැව, යන මේවාත් අපගේ ප්‍රදේශයෙහි තිබෙන ප්‍රසිද්ධ වැව් කීපයක්. ඒ වැව් කීපය නිසි පිළිදි සකස් කරනවා නම් ඒ ප්‍රදේශයේ ගොවීන්ට විශාල යහපතක් වන බව මා පෙන්වා දෙන්නට කැමතියි. මහවැලි ගඟ පිළිබඳ සිහිනය මේ වර අය වැය ලේඛනයෙහි සඳහන් වී තිබෙන බව වත්තේගම ගරු මන්ත්‍රීතුමා (පී. බී. ඒ. වීරකෝන් මයා.) ප්‍රකාශ කළා. බොහෝ කලක සිටම සෑම අයවැය ලේඛනයකම මහවැලි ගඟ යෝජනා ක්‍රමය සඳහන් වීම අපට පුරුදු දෙයක්. එය මේ අයවැය ලේඛනයෙහි පමණක් අලුතෙන් සඳහන් වූ දෙයක් නොවෙයි.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்லே)*
(The Hon. Hurulle)

පළමුවැනි වතාවට මේ ව්‍යාපාරය සඳහා මුදල් වෙන් වී තිබෙන්නේ මේ අයවැය ලේඛනයෙනුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. තෙන්නකෝන් මයා.**
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

මහවැලි ගඟ යෝජනා ක්‍රමයේ නොයෙක් අංශ සඳහා මීට පෙරත් මුදල් වෙන් වී තිබෙන බව මීට පෙර අයවැය ලේඛනවලින් පෙන්වා දෙන්න ට මට පුළුවනි. ඒමගි මූලික කටයුතු වෙනුවෙන් රුපියල් එක්කෝටි ගණනක මුදලක් මේ අයවැය ලේඛනයෙනුත් වෙන් වී තිබෙන බව අපට පෙනෙනවා. මීට පෙරත්, පණස් දාහ, ලක්ෂය හමාර ආදී වශයෙන් මුදල් වෙන් වුණා.

අ. භා. 5.15

වැව් කොපමණ බැන්දත්, වෙනත් වාරි මාර්ග ක්‍රම කොපමණ ඉදි කළත්, වතුර ලබා ගැනීමේ ස්ථිර මාර්ගයක් නැත්නම් අපේ ප්‍රදේශවල ගොවීන්ට ජීවත් වන්නට පිළිවෙළක් නැති බව මා කියන්නට ඕනෑ. වතුර හැර වෙනත් කිසිම දෙයක් වියළි කලාපයට වුවමනා කරන්නේ නැහ. ඒ පළාතට වතුර ලබා ගැනීමට එතරම් අමාරුවක් ඇත්තේත් නැහැ. එහෙත්, එය මෙතෙක් ඉෂ්ට නොවීම ගැන, මෙතෙක් වරින් වර රට පාලනය කළ සෑම ආණ්ඩුවක්ම ලජ්ජා විය යුතු බව මා ප්‍රකාශ කරනවා. මේ රටේ එක කොටසක ජනතාව වතුර නැතුව දුක් විඳීම ගැන හැම ආණ්ඩුවක්ම ලජ්ජා විය යුතුයි. මා පදිංචිව සිටින්නේ මහනුවරයි. මහනුවර ගංවතුර ගලන අවස්ථාවේදීම දඹුල්ලේ බීමට පවා වතුර නැති වෙනවා. ගංවතුරෙන් බේරී කටුගස් තොටින් එගොඩ වී මාතලේ නාලන්ද පසුකර දඹුල්ලට පැමිණෙන විට එහි බොන්නවත් වතුර නැහැ. වතුර සොයා හැතැප්ම තුන හතර යන්නට දඹුල්ල ප්‍රදේශවාසීන්ට සිදු වෙනවා. හැතැප්ම 25 ක් 30 ක් දුරින් පිහිටි මේ ප්‍රදේශ දෙකෙන් එකක් ගංවතුරෙන් යට වන අතර අනෙක් ප්‍රදේශයේ බොන්නවත් වතුර නැහැ. ගංවතුර ගලන කාලයේදී එක්රැස් වන ජලය ඒ අවට වැව්වලට යැවීමට වැඩ පිළිවෙළක් යෙදෙනවා නම් මෙවැනි තත්ත්වයක් ඇති නොවන බව මා කියන්නට කැමතියි. එක් වැවක් බැන්දොත් අනෙක් වැවකට පාඩුවක් සිදු වේය යන අලුත් මතයක් දැන් ඇති වී තිබෙනවා. හුරුළුවැවේ ජලයට පාඩු සිදු වෙතැයි යන මතය අනුව මාතලේ ප්‍රදේශයේ වැව් බොහෝ කාලයක් තිස්සේ නොබැඳ තිබුණා. අනික් බෑවුමේ කලා වැවට වතුර නැති වෙනවාය කියා අපේ පැත්තේ වැව් බැඳීම් අත්හිටවා තිබුණා. අප විශාල වැව් බඳිනවා නම් හැතැප්ම 10 න් 10 ටවත් විශාල වැව් ඇති කර ඒ වැව් පුරවා ඊට පසු සෑම ගමකම ඇති කුඩා වැවකට ඇලවල් මගින් ඒ විශාල වැව්වලින් ජලය ලබා දෙන්නට ඕනෑ. එසේ ජලය ලබා දී පෙර මෙන් විශාල ජලාශ තිබෙන ප්‍රදේශයක් බවට වියළි කලාපය පත් කරන තුරු ඒ කලාපයේ මිනිසුන්ට නිදහසේ ජීවත් වන්නට බැරි බව, සැපවත්ව ජීවත් වන්නට බැරි බව, ඒ කලාපයේ පදිංචි මිනිසුන්ට මේ රටේ ජනතාව ආහාර සම්පාදනය කරන්නට බැරි බව අප කණගාටුවෙන් වුණත් ප්‍රකාශ කරන්නට ඕනෑ. එවැනි ක්‍රමයක් ඇති කරනවා නම් එය මොන ආණ්ඩු කළත්, මොන ඇමතිවරුන් කළත් අපට කමක් නැහැ. අපට වුවමනා කරන්නේ අපේ ජනතාවට නියම පිළිවෙළට ජීවත් වීමට මාර්ගයක් ඇති කර දීමයි.

ගරු සභාපතිතුමනි, කැලෑ කියන ඒවා අද සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. කැලෑවල අද කිසිම ගහක් නැහැ. ප්‍රවාහන ඇමතිතුමා නාලන්දේ සිටි කාලයේදී තිබුණු කැලෑ ගස් අද ඒ ප්‍රදේශයේ නැහැ. කැලෑවකින් කෝටුවක්වත්, කෙවිටක්වත් කපා ගන්නට මිනිසුන්ට දැන් පුළුවන්කමක් නැහැ. කැලෑව සම්පූර්ණයෙන්ම විනාශ වී ගිහින්.

ගරු ඇමතිතුමා දැන් පෙනෙන්නට නැහැ. එතුමාගේ මස්සිනා කෙනෙක් කන්තලේ පත්තේ කැලය සම්පූර්ණයෙන් විනාශ කර දැව අරගෙන එන බව මට ආරංචියි. ඒ තැනැත්තා පදිංචිව ඉන්නේ දඹුල්ලෙයි. නමුත් දඹුල්ලෙ ඉන්නෙ නැතිව එහෙ ඉන්නවා. මිනිසුන් කියනවා ඒ තැනැත්තා එහෙ ඉඳගෙන කැලෑ කපාගෙන ඇවිත් කඳන් විකිණීමේ ව්‍යාපාරයක යෙදෙනවාය කියා. හුඟක් කැලෑවලට සිදු වී තිබෙන්නේ ඒ දේ බව අපට දැනගන්නට ලැබී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

]ටී. බී. තෙන්නකෝන් මයා.[

ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නොයෙක් නොයෙක් ආරාවුල් නිරවුල් කිරීමෙන් අපේ ප්‍රදේශවල සේවයක් කර තිබෙනවා. ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ එක හොඳක් තිබෙනවා. ඒ කාර්යාලයේ නිලධාරි මහත්වරුන්, යම් කිසි දෙයක් කිව්වාම එයට පිළිතුරු දෙනවා; ඒ ගැන සොයා බලනවා. මා ගිය වාරයේ අයවැය විවාදයේදී කිව්වා, එක ගමක් නිරවුල් කර තිබෙන පිළිවෙල සම්පූර්ණයෙන්ම වැරදිය. මුළු ගමම ඊට විරුද්ධව සිටිනවාය කියා. මා ඉතා ස්තුතිවන්තව කියනවා, ඒ නිලධාරි මහත්මයා එම ගමට ගිහින් දවසක් මුළුල්ලේම ගමේ මිනිසුන්ගෙන් කරුණු ඇසුවා. මිනිසුන්ට උදව්වක් කළත්, නැතත් ඒ විධියට කරන පැමිණිලි ගැන සොයා බැලීම ඉතාමත් වැදගත් බව මා කියන්නට සතුටුයි. ඒ විධියේ නිලධාරීන් දකින්නට මා ඉතා කැමති බවත් මේ අවස්ථාවේදී ඉතා ඕනෑකමින් සඳහන් කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශවල වාසය කරන අය වැඩි වශයෙන්ම ගොවීන් වශයෙන් ජීවත් වන උදවියයි. ඒ උදවියට ජලය වුවමනා කරනවා. එම නිසා මේ අමාත්‍යාංශය මගින් වාරිමාර්ග කටයුතු දියුණු කර වැඩ කරන ලෙස මා ඉල්ලා සිටිනවා. දීර්ඝ කාලයක සිට දඹුල්ලට විදුලි බලය බලාපොරොත්තු වෙනවා. මේ වර මැන ගෙන යනවා. විදුලි බලය සැපයීමට වන්නට ඇති. මින්නේරියට යන ගමන්ද දන්නේ නැහැ. කොහේ යන ගමන් වුණත් අපටත් ටිකක් එළිය දීමට කටයුතු කිරීම ගැන මා ප්‍රීති වන බව ප්‍රකාශ කරනවා.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

අප ජීවත් වන්නේ තෙත් කලාපයේ නිසා පළමුවෙන් තෙත් කලාපය පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා. පසුගිය කාලයේ අගමැතිතුමාත් තෙත් කලාපයේ සංචාරයක යෙදුනා. එතුමාත් මා කියන කරුණු ගැන හොඳ අවබෝධයක් ඇති කර ගත්තොත් අප මුහුණ පා තිබෙන තත්ත්වයන්ගෙන් නිදහස් වීමටත්, ආහාර වගාව දියුණු කර ගැනීමටත් එය ප්‍රයෝජනවත් වේය කියා මා කල්පනා කරනවා. තෙත් කලාපයේ තිබෙන ලොකු විසංගතයක් නම් වතුර වැඩි කමයි. වතුර බැසීමට තිබෙන ඇළවල් නියම අන්දමට හාරා ශුද්ධ නොකරන නිසාත්, විශාල ජල ගැලීම් වැළැක්වීමේ ව්‍යාපාර නොමැතිකම නිසාත් මාතර, ගාල්ල, කළුතර යන දිස්ත්‍රික්කවලින් පමණක් නොව මුළු තෙත් කලාපයේ හැම කොටසකින්ම නියම අන්දමට ප්‍රයෝජන ගන්නට බැරි තත්ත්වයක් පවතිනවා. ජනගහනයෙන් සියයට 70 ක් ජීවත් වන්නේ තෙත් කලාපයේයි. එහෙත් ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් තෙත් කලාපයට ඇත්තේ සියයට 30 යි. ඒ නිසා මේ වැඩි ජනගහණය ජීවත් වන ප්‍රදේශය තුළ පුළුවන් තරම් දුරට ආහාර ද්‍රව්‍ය වගා කිරීමට ආධාර දීමේ අවශ්‍යතාව මා විස්තර කර දෙන්නට වුවමනාවක් නැහැ. එහෙත් තෙත් කලාපයේ තිබෙන ප්‍රශ්න විසදීම සඳහා දැන් අනුගමනය කරගෙන යන්නේ ඒ කොටසේ සිටින ජනතාව වියලි කලාපයට ගෙන ගොස් පදිංචි කරවීමයි. එහෙත් තෙත් කලාපයේ ජල ගැල්ම වැළැක්වීම සඳහා නවීන ඉංජිනේරු ක්‍රම යෙදවීමත් තෙත් කලාපයේ වැඩි වතුර වියලි කලාපයට හැරවීමත් අවශ්‍යයි. තෙත් කලාපයේ වතුර පොදක් වත් තෙත් කලාපයෙන් මුහුදට ගලා යා නොදී වියලි කලාපයට හැරවීමට පුළුවන් බව පෙන්වන වාර්තාවක් එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශේෂඥයන් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව බලන විට තෙත් කලාපයේ ගං වතුර වැළැක්වීමේ ව්‍යාපාරය විශාල වශයෙන්ම වියලි කලාපයට ප්‍රයෝජනවත් වෙනවා. එය මා දිගින් දිගට විස්තර කිරීම අනවශ්‍යයි.

නිල්වලා ගඟේ ගං වතුර වැළැක්වීම සඳහා ගඟ ඉහත්තාවේ වේලි බැඳීම හා නිල්වලා ගඟේ වතුර හම්බන්තොට දිස්ත්‍රික්කයට හැරවීමට ක්‍රියා කිරීම සම්බන්ධයෙන් අප කාලයක් තිස්සේම ඉල්ලා සිටියා. දැන් ඒ සම්බන්ධයෙන් සැලැස්මක් සකස් කර තිබෙන බවත්, ලබන මාසයේ හෝ මේ මාසයේ හෝ ඒ සැලැස්ම ඉදිරිපත් කරන බවත් ගරු ඉඩම් ඇමතිතුමාත් නිලධාරි මහත්වරුනුත් ප්‍රකාශ කර තිබෙ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

නවා. ඒ සැලැස්ම නිල්වලා ගඟට පමණක් සීමා නොකර ඒ ගඟේත් ගිං ගඟෙත් කළු ගඟේත් වැඩි ජලය වියලි කලාපයට හැරවීමේ ඒකීය ව්‍යාපාරයක් හැටියට සකස් කර තිබෙන බව ගරු ඉඩම් ඇමතිතුමාගෙන් දැන ගන්නට ලැබුණා. වැඩි කලක් යන්නට මත්තෙන් අප වෙත මෙම සැලැස්ම ඉදිරිපත් කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම සැලැස්ම ඉදිරිපත් කළ විගාම එය ක්‍රියාත්මක කරනවා ඇතැයි ද බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මාතර කෘෂිකර්ම කාරක සභාව අවුරුදු දහයක් තිස්සේ මේ සම්බන්ධව පිට පිටම වාර්තා ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාවල ලුහුඩු විස්තරයක් මම ඉදිරිපත් කරන්නම්. මාතර දිස්ත්‍රික්කයේ ගොවිතැන් කරන ඉඩම් ප්‍රමාණය අක්කර 50,000 යි. ඉන් අක්කර 45,000 ක් ගොවිතැන් කරන්නේ මාස් කන්නයේදී යි. යල් කන්නයේදී අක්කර 42,000 ක් ගොවිතැන් කරනවා. එතකොට යල මහ දෙකේදීම ඉඩම් වැඩි කොටස ගොවිතැන් කරනවා. එහෙත් 1965-66 වර්ෂයේදී ඇති වූ ගංවතුර නිසා වී බුසල් 4,68,000 ක් විනාශ වුණා. මුදලින් අලාභය, රුපියල් 50,00,000 යි. මේ විධියට, 1963 දී දොළොස් වාරයක් ගංවතුර ගැලුවා. 1965 සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා පස් වාරයක් ගංවතුර ගැලුවා, මාතර දිස්ත්‍රික්කයේ. කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරීන් ගිහින් ගොවීන්ට කොයිතරම් අවවාද කළත්, මෙවැනි තත්ත්වයක් පවතින විට ගොවිතැනේ දියුණුවක් ඇති වන්නේ කොහොමද ? ගංවතුරින් ගොවිතැනට සිදු වන හානිය අඩු කර ගැනීමේ ක්‍රමය දැන් පැහැදිලිව අවබෝධ වී තිබෙනවා. ඒ සඳහා කළ යුතුව තිබෙන්නේ, ජලාශ ඇති කිරීමයි. හැබැයි, ඒ සඳහා ඉඩම් ටිකක් යට කරන්නට නම් වෙනවා. මස්කෙළිඹය ජලාශය තැනීමේදී ලංකාවේ තිබෙන හොඳම තේ වතු අක්කර 4,000 ක් පමණ ජලයෙන් යට වෙනවා. ඒ විතරක් නොවෙයි, මස්කෙළිය නගරයත් කින්වයර් කඩ පොළත් යට වෙනවා. එසේ නැතිව රටේ අනාගත සංවර්ධනය සඳහා කටයුතු කරන්නට බැහැ.

මාතර දිස්ත්‍රික්කයේ අක්කර 50,000 ක පමණ ගොවිතැන ආරක්ෂා කරන්නට නම්, යල මහ දෙකටම වැඩ කරන්නට නම්, අර විධියේ ජලාශ ඇති කරන්නට සිදු වෙනවා. මාතර දිස්ත්‍රික්කයේ, අක්කරයකට වී බුසල් 35 ක් ලැබෙනවා. අනෙක් හැම තෙත් ප්‍රදේශයකටම වඩා වැඩි අස්වැන්නක් ලැබෙන්නේ, මාතර දිස්ත්‍රික්කයෙනුයි. ගංවතුර ගැලීම් තිබුණත්, පොළොවේ සරුසාරකම නිසා එවැනි අස්වැන්නක් ලැබෙනවා. ගංවතුරින් වන හානිය වළක්වා ගත්තොත්, මාතර දිස්ත්‍රික්කයේ කුඹුරු අක්කරයකින් වී බුසල් හැට හැත්තෑවක් ලබා ගන්නට පුළුවනි, දෙකන්නයේම.

අ. භා. 5.30

අගමැතිතුමා අපේ ප්‍රදේශයේ මලිදුව ගොවි කාරක සභාවට පැමිණියා. මලිදුවට ඉහළින් තිබෙන අක්කර 10,000 ක පමණ තහනම් ප්‍රදේශයේ වතුර ගලා බහින්නේ, නිල්වලා ගඟේ අතු ගංගාවක් වන ගිගිලි ගඟ මඟිනුයි. මලිදුවේ සිට හැතැප්ම 4 ක් ඈතින් ජලාශයක් ඇති කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව යෝජනා කළා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහතුන් ගිහින් ඒ ගැන පරීක්ෂා කර බලා කීවා, දිගිලි ගඟ දිගේ ගලා බසින වතුර ගොවිතැන් කිරීමට පමණක් නොව, ගාල්ලේ සිට තංගල්ල දක්වා මුදුකර ප්‍රදේශයේ මිනිසුන්ට බීම සඳහා පාවිච්චි කිරීමටත් යෝග්‍ය බව. ලබුගම හා කලටුවාවේ ජලාශවලට වඩා හොඳ ඒ වතුර ජලාශයක තැන්පත් කර, වතුර පිරිසිදු කිරීම සඳහා මුදල් වියදම් නොකර, පොම්ප නොකර, උස් බිමේ සිට පහත් බිමට ගලා බසින්නට සලස්වා වතුර බීමට ගන්නට පුළුවන් බව ඒ වාර්තාවේ තිබෙනවා. මා ඒ වාර්තාවෙන් කොටසක් කියවන්නට කැමැතියි :

"The Irrigation Department Scheme is draw-off for cultivation purposed in the draw-off for cultivation purposes in the area is small—probably about one tenth of the quantity available.

If this source is to be utilized for a water supply, it should cover the whole of the Southern coastal towns including towns and villages en-route extending from Galle at one end to Tangalle possibly at the other end.

There is sufficient rainfall in the catchment area and spread throughout the year.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

The source with the storage to be impounded would be more than adequate to meet the demands of all those towns with an estimated population of 400,000 in the year 2,000 A. D. at 75 gls. per head per day,"

මේ තරම් අගනා ස්වාභාවික වස්තුවක් තිබුණත්, මුදුකරයේ තිබෙන තංගල්ල, දික්වැල්ල, ගන්දර, කෝට්ටේගොඩ,, දෙවුන්දර, මාතර කඹුරුගමුව, මිරිස්ස, වැලිගම, අහංගම හා ගාල්ල යන ප්‍රදේශවල ජනතාව පිරිසිදු වතුර මදිකම නිසා ඉතා දුඃඛිත තත්ත්වයකිනුයි, අද ජීවත් වන්නේ. මුහුදුකර ප්‍රදේශවලට ජලය ලබා ගැනීමේ ව්‍යාපාරයක් ඇති කළ හැකි අන්දම ගැන විස්තරයක් රජයට ඉදිරිපත් කර තිබෙනවා. එක රබර් වත්තක්වත් එක තේ වත්තක්වත් යට වන්නට ඉඩ නොතබා එක ගෙයක්වත් යට වන්නට ඉඩ නොතබා තහනම් කැලෑ ප්‍රදේශවල තැනූ ජලාශවල වතුර රඳවා තබා ගතහැකි ව්‍යාපාරයක් ඉංජිනේරුවන්ගේ අනුමැතිය ඇතුව රජයට ඉදිරිපත් කර තිබෙනවා. [බාධා කිරීමක්] අවසන් වරට ඉදිරිපත් කළේ 1965 දීයි. ජල සම්පත් මණ්ඩලයටත් මෙය ඉදිරිපත් කළා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ඉදිරිපත් කළේ කොයි අවුරුද්දේද?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
මා සිතන්නේ 1966 දීය කියායි. Water Resources Board එක පිහිටෙව්වේ 1966 දීයි. එම අවස්ථාවේදීම වාගේ එය මා ඉදිරිපත් කළා. එසේ හෙයින් මෙවැනි ව්‍යාපාර සම්බන්ධව විශේෂ උනන්දුවක් ඇතුව කටයුතු කරන්නට වුවමනායි. මහවැලිගඟ ව්‍යාපාරය රටේ දියුණුව සඳහා ඉතා අවශ්‍යයි. අද ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයෙහි සිටිනවා, ඉතා හොඳ පළපුරුද්දක් ලබා තිබෙන, වැඩ කිරීමෙහි හොඳ හැකියාවක් ඇති, දක්ෂ විශේෂඥ ඉංජිනේරුවන් එහෙම. එසේ හෙයින් මෙවැනි ව්‍යාපාර ඇති කිරීමේදී විදේශ කොම්පැනිවලට කොන්ත්‍රාත් පිට ඒවා පවරා දෙමින් ක්‍රියා කරන්නට වුවමනා නැහැ. උඩවලවේ ව්‍යාපාරයේ කටයුතු සඳහා වෙනස් වෙනස් ලංකාවේ කොන්ත්‍රාත් සමාගම් යෙදවූ බව ඇත්තයි. එහෙත් එම ජලාශය බැඳීමේදී ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ විශෙෂඥයන්ගේ සම්බන්ධකම් ඇතුව ලාංකික කොම්පැනියක් මගිනුයි කටයුතු කළේ. ඒවාගේම අද මස්කෙළිඔය ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම වාගේ කරන්නේ ලාංකික කොම්පැනියක් මගිනුයි. එනම්, ඩිවෙලොප්මන්ට් ඉන්ජිනියරිං කොම්පැණියයි. එහි සිටින සියළුදෙනාම ලාංකික ඉංජිනේරුවනුයි. කඳු තුලින් වතුර ගැනීම සඳහා බිම් ගෙවල් ඔස්සේ නල යෙදීම ගැන අපේ ඉංජිනේරුවන්ට පළපුරුද්දක් නොමැති හෙයින් යුගෝස්ලේවියානු කොන්ත්‍රාත් කරුවන්ට එම කටයුත්ත පවරා පොල්පිටියෙහි වැඩ කටයුතු කරගෙන යන බව පෙනෙනවා. එවැනි කටයුතු සඳහා ඒ අන්දමේ සමාගම් යෙදවීම අවශ්‍යයයි.

ගරු සභාපතිතුමනි, ඉහත කී අන්දමේ කටයුතුවල නියුක්ත වූ සමාගම් දෙකක් අද ලංකාවේ වැඩ කරනවා. ඒ උදවියගේත් සම්බන්ධකම් ඇතුව මහවැලි ගඟ හැරවීමේ ව්‍යාපාරය ගිං ගඟ වාපාරය නිල්වලා ගඟ ව්‍යාපාරය වැනි ඒවායේ කටයුතු කරන්නට පුළුවනි. පිටරට කොම්පැනිවලට ටෙන්ඩර් මාර්ගයෙන් වැඩ පවරා දෙන්නේ නැතුව ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයෙහි සිටින විශේෂඥයන්ට ප්‍රමුඛත්වය දෙමින් මේ රටේම සැළැස්මවලට අනුව, ඇස්තමේන්තුවලට අනුව, කටයුතු ගෙන යන්නට පුළුවන්කම තිබෙනවා. සැළැස්මවල් පිළිබඳ කටයුතු සහ නොයෙකුත් පරීක්ෂණ කටයුතු මේ රටේ උදවියටම කරන්නට පුළුවනි.

ගංවතුර ගැලීමෙන් වන පාඩුව් ගැන මා සඳහන් කරන්නට යෙදුණා. ලංකාවේ ඉතාම හොඳට එළවළු වගා කරන්නට පුළුවන්කම තිබෙන බිම් ප්‍රමාණයක් මාතර දිස්ත්‍රික්කයේ දෙනිපිටිය ප්‍රදේශයේ පිහිටා තිබෙනවා. එළවලු වගාවට වෙන් වූ ඓතිහාසික ප්‍රදේශයක් වශයෙන් අපට එම ප්‍රදේශය හඳුන්වන්නට පුළුවනි. එළවලු වගාවට ඉතාමත්ම යෝග්‍ය සරුසාර එම භූමි ප්‍රදේශය අක්කර 1,250 කින් පමණ සමන්විතයි. එහෙත් දැන් එහි එළවලු වගාව සම්පූර්ණයෙන්ම වාගේ ඇනහිට තිබෙන බව පෙනෙනවා. අක්කර 500 ක පමණ එළවලු වගාව සඳහටම වාගේ අතහැර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා. ඉතිරි අක්කර 750 ප්‍රමාණය වත් ආරක්ෂා කර ගැනීමට වුවමනා නම් එම ප්‍රදේශයට වතුර ගැලීම වහාම නැවිත් වීමට පියවර ගත යුතුයි.

ඉඩම් ඇමතිතුමා අයවැය විවාදයේදී මෙසේද කියා තිබෙනවා :

"I constructed the Uda Walawe, the biggest reservoir ever built in *Ruhunu Rata*. I called it Uda Walawe—not somebody's *Samudra*. Then I built the Rajangana Wewa in Nuwara Kalaviya which is the biggest reservoir in that area. It is greater than Kala Wewa, and it is bigger than Nuwara Wewa and it is also bigger than Padaviya. I named it Rajangana Wewa."—[OFFICIAL REPORT, 19th August 1968; Vol. 80, c. 1918.]

ගරු ඇමතිතුමා, මේ වැව් සෑදීම පිළිබඳව, තමාගේම දක්ෂතාවය පිළිගැනීම ගැන මගේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මගේ කණගාටුවට හේතුවී තිබෙන්නේ මේකයි. මේ කටයුතු කළේ තමාගේ දක්ෂතාවයක් උඩ නොව ඒ මණ්ඩලවල වැඩ කරන විශේෂඥයින්ගේත් ඉන්ජිනේරුවරුන්ගේත් ඒ වාගේම කොන්ත්‍රාත් වැඩ කළ ලාංකික ඉන්ජිනේරුවන්ගේත් දක්ෂතාවය උඩය කියා එතුමා පිළිගන්නා බවක් පෙනෙන්නේ නැහැ. දේශප්‍රේමී හැඟීම්වලින් යුක්තව ඔවුන් වැඩ කළ නිසා, සහයෝගය දුන් නිසා මේ කටයුතු කර ගන්නට පුළුවන් වූ බව එතුමා පිළිගන්නේ නැහැ. ඒකයි මගේ කණගාටුව. යම් කාර්යයක් පිළිබඳව තමන් මේ වැඩේ කළාය කියා යම් ඇමතිවරයකු ප්‍රශංසාව ලබා ගන්නවාට අපේ කිසි විරුද්ධයක් නැහැ. නමුත් සුදුස්සන්ට නියම සැලකිලි නොදැක්වීම ගැනයි මගේ කණගාටුව. විශේෂයෙන්ම මහවැලි ගඟ හැරවීමේ ව්‍යාපාරය පිළිබඳව ගරු ඇමතිතුමා එදා කථා කළේ කොහොමද ? මා එදා ප්‍රශ්න කීපයක් ඇසුවා. හැන්සාඩ් වාර්තාවෙන්ම මා එය උපුටා දක්වන්නම් :

"DR. S. A. WICKREMASINGHE: You do not want to depend on the River Valleys Development Board and on the present engineers. You want to call for American experts.

THE HON. C. P. DE SILVA: We cannot do it."

"DR. S. A. WICKREMESINGHE: You cannot do it?

THE HON. C. P. DE SILVA: Well, we can build it up, but—

DR. S. A. WICKREMASINGHE: Why do you want the E. C. I.?

THE HON. C. P. DE SILVA: The E. C. I. are preparing detailed plans as advised by the U. N. D. P. team.

DR. S. A. WICKREMASINGHE: My information is that the River Valleys Development Board can draw up the plans and do it themselves. The Ceylon engineers with their experience in Uda Walawe can do it.

THE HON. C. P. DE SILVA: Sir, the F. A. O.-U. N. D. P. team, who prepared the project plan, the feasibility report, have advised us to get a foreign team to do this. And we cannot get the contractors to start by January or February. We have to start early, and we would not be able to start early. We have to utilize the services of our engineers. Otherwise we cannot do it.

DR. S. A. WICKREMASINGHE: There is the River Valleys Development Board with Mr. Kahawita as Chairman."

මා ඒ අවස්ථාවේදී මෙහෙම කිව්වා.

DR. S. A. WICKREMASINGHE: They can do the first stage. The diversion can be done by them.

THE HON. C. P. DE SILVA: The hon. Member can do it his way. We shall do it our way."—[OFFICIAL REPORT, 19th August 1968; Vol. 80, cc. 1924-6.]

ඒකයි ඇමතිවරයා දුන් උත්තරය. එමනිසා මා නැවතත් ගරු අගමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ මහවැලි ගඟ හැරවීමේ ව්‍යාපාරය ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ ප්‍රමුඛත්වයෙන් කරන්නට පුළුවනි. දැන් අළුත් තත්ත්වයක් තිබෙනවා. ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය යටතේ වැඩ කරන පුහුණු කම්කරුවන් හාරදාහසක් පමණ දැන් සිටිනවා. ඒ කම්කරුවන්ට රක්ෂා සැපයිය යුතු නිසා දැන් ඒ උදවිය රජයේ කොන්ත්‍රාත් අරගෙන වැඩ කරනවා. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු කරනවා. පාරවල් කීපයක කටයුතු කරනවා. ඉන්ජිනේරුවන්ගේ නායකත්වයෙන් වැඩ කරන මේ කම්කරුවන් ගිය අවුරුද්දේ උඩවලවේ ව්‍යාපාරයේ කළ වැඩ වලින් රුපියල් හතළිස් ලක්ෂයක පමණ පළමුවෙනි වරට ලාභයක් ලබා තිබෙනවා. ඒ වාගේම ඒ කණ්ඩායම ගල් ඔය කළ වැඩවලිනුත් පළමුවරට විශාල ලාභයක් අත් කරගෙන තිබෙනවා. එම නිසා, දැන් අළුත් තත්ත්වයක් තිබෙන නිසා පරණ අධිරාජ්‍යවාදී කාලයේ කළා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

වාගේම ඇනුත් ඔය තක්සේරු කිරීම් කරන්නට, ඇස්තමේන්තු පිළියෙළ කරන්නට, සැලසුම් කරන්නට විදේශික විශේෂඥයන්ම ගෙන්වන්නට වුවමනා නැහැ. මහවැලි ගඟ හැරවීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මණ්ඩලය මාර්ගයෙන් ලෝක ප්‍රසිද්ධ විශේෂඥයින් අතින් පිළියෙළ වූ විස්තරාත්මක වැදගත් වාර්තාවක් අපට ඉදිරිපත් කර තිබෙනවා. ප්ලෑන් ඉදිරිපත් කර තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරන්නට තවත් විදේශීය කොම්පැනි වුවමනා කරන්නේ නැහැ. ඒ උදවියගේ වාර්තා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයත් ලෝක බැංකුවත් යන දෙක කලවම් කර ගන්නට එපා. කියන්නේ යටත් විජිත ඇති කරන්නට ඇමෙරිකන් ධනපතීන් සම්බන්ධ වූ බැංකුවක් නොවෙයි. ඒ මණ්ඩලයෙන් මුදල් ණයට ගන්නවා නම් ඉතාමත් අඩු පොලියකට ලබා ගන්නට පුළුවනි. සමහර විට පොලියක් නැතිවමත් ලබා ගන්නට පුළුවන් වේවි. ගෙවිල්ලත් බොහොම හෙමින්, අවුරුදු පණහකින් පමණ ණය ගෙවන්න ඉඩ ලැබෙනවා. ලෝක බැංකුවෙන් දෙන ඒවා එහෙම ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඔය සංවර්ධන දෙක කලවම් කර ගන්නට එපා. කලවම් කර ගන්නට හොඳ නැහැ. ලෝක බැංකුව මොකක්දැයි දැනගන්නට ඕනෑ. මොවුන් මහන්සි ගන්නවා මේ දෙකම එකක් හැටියට පෙන්වන්නට.

උඩ වලවේ වේල්ල කොයි තරම් දක්ෂ ලෙස බැඳ තිබෙනවා ද? මේ වේල්ල බඳින්නට බැරි වෙයි කියලා බොහෝ දෙනා කිව්වා. වර්ෂාව එන්නට ඉස්සර බඳින්නට බැරි වෙනවාය කිව්වා. වර්ෂාවට වතුර ආවාම පහත්කඩ සම්පූර්ණයෙන් යට වෙනවාය කිව්වා. අම්බලන්ගොඩත් යට වෙනවාය කිව්වා. ලාංකික කම්කරුවන්ගේ දක්ෂකම නිසා දවස් හැටකදී පස් වැඩ ඉවර කළා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

බැහැ කියලා කිව්වේ කවුද?

අ. භා. 5.45

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

පත්තරවල එහෙම ලියා තිබුණා. ඒ වුණාට කුඩා වැටෙන්නේ නැති බවත්, වර්ෂා කාලය එන්නට මත්තෙන් ඒ වැඩ කොටස අවසන් කරන්නට පුළුවන් බවත්, ඒ සඳහා අපේ උදවියට ශක්තිය තිබෙන බවත් අපි දැනගෙන සිටියා. ඒ කොයි හැටි වෙතත් පත්තරවල තිබුණු දෙයක් ගැනයි මා ඒ සඳහන් කළේ. මීට සම්බන්ධ වූ හැම දෙනාම දක්ෂ ලෙස වැඩ කළා. ඒ අයට අපි ගරු කරන්නට ඕනෑ. ගරු කරන්නට ඕනෑ උදවියට ගරු කරන්නට අපි කවදත් ලෑස්තියි. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ සේවයේ නියුතු ලාංකික ඉංජිනේරු මහතුන්ගේ ප්‍රමුඛත්වයෙන් කරන ලද ඒ විශාල වැඩ කොටස ගැන අපට ඉතා සන්තෝෂ වන්නට පුළුවනි. පළමුවැනි වරට මෙවැනි විශාල ගංගාවක් හරස් කර සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වුණු—මෙය ගල්ඔයට වඩා විශාල වැඩක්—උදවියට නම්බුව දෙන්නට ඕනෑ. ලංකාවේ අපේ ඉංජිනේරුවරුන්ට එය දක්ෂ ලෙස කරන්නට පුළුවන් වූ බව පිළිගන්නට ඕනෑ. එහෙමූ නම් ඒ උදවියටම මහවැලි ගඟ හරවන ව්‍යාපාරයේ කටයුතු කරන්නට දෙන්නට බැරි ඇයි? ඒකයි මම මේ ආණ්ඩුවෙන් අහන්නේ.

ආණ්ඩුවෙන් නිකුත් කරන "නිව්ස් ලෙටර්" පත්‍රයේ ලිපියක මහවැලි ව්‍යාපාරය ගැන මෙහෙම තිබෙනවා:

"The findings of this Mission will be added as a supplement to the overall feasibility report on the Mahaweli Ganga Basin Development Project compiled by the UN Development Programme."

මෙහි තවත් කොටසක් තිබෙනවා. ඒකත් මම කියවන්නම්.

"Review the respective responsibilities of the Ministries involved in land settlement, the role of Government Departments, and the co-ordination of these activities.

Examine the structure of the River Valleys Development Board, its functioning as a construction and development agency and its suitability or implementing the Mahaweli Ganga Project."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෝක බැංකුවෙන් අහනවා, එක්සත් ජාතික මණ්ඩලයෙන් කළ කටයුත්තක් ගැන අපේ අයට මේ වැඩ කරන්නට පුළුවන්දැයි දැනගන්නට වුවමනාය කියනවා. මෙය අපේ ජාතියට කරන නින්දාවක්, වැඩ කර තමන්ගේ දක්ෂකම මනාව පෙන්වූ විශේෂඥයන් ගැන සළකන්නට ඕනෑ. ගල්ඔයේ ඇමෙරිකන් කොන්ත්‍රාත්කාරයින විසින් විනාශ කරන ලද යන්ත්‍ර සියල්ලම පරණයකඩ මෙන් විකිණීමට ඉඩ නොදී අලුත්වැඩියා කර රුපියල් හැත්තෑ ලක්ෂයක් පමණ වටිනා විශාල යන්ත්‍ර යොදා ලාංකික ඉංජිනේරු මහත්වරුන් උඩ වලවේ වැඩ ටික සාර්ථක අන්දමින් කළා. අලුතින් යන්ත්‍ර ගෙන්වන ලද්දේ සුළු ප්‍රමාණයක් පමණයි. එය සම්පූර්ණයෙන් සාර්ථක අන්දමට කළා. මේ ව්‍යාපාරයේ කටයුතු කරගෙන යන්න අපේ ඉංජිනේරුවන් සුදුසුද කියා විදේශීය ආයතනවලින් අහන්නට කලින්, මේක තමුන්නාන්සේලාට කරන්න පුළුවන්ද කියා උඩ වලවේ ව්‍යාපාරයේ කටයුතු කළ අපේ විශේෂඥයින්ගෙන් අහන්නට ගරු ඇමතිතුමාට යුතුකමක් තිබුණා. මම පක්ෂ භජනයෙන් දොස් කීමේ අදහසින් මේ කාරණය ඉදිරිපත් කරනවා නොවෙයි. තමන්ගේ කාලයත් තමන්ගේ ශ්‍රමයත් යොදල දේශ ප්‍රේමයෙන් ජාතික සංවර්ධන ව්‍යාපාරවල යෙදුණු ඒ විශේෂඥයන්ගේ ඒ නිලධාරීන්ගේ සේවය අපි අගේ කොට සලකන්ට ඕනෑ. මා විශේෂයෙන් මේ කාරණය ගැන සඳහන් කළේ ඒ නිසයි. ඒ හැරත් ලෝක බැංකුව ගැන විශ්වාසය තැබීම ඉතාම භයානක දෙයක්. ලංකාවේ ජල විදුලිබල ව්‍යාපාර යොදවන්න එතරම් පහසුකම් නැති බව 1952 දී ලෝක බැංකුව කියා සිටි බව මතකද? "කඳුකරයේ විශාල ජලාශ ඇති කරන්ට බැහැ. විදුලිබලය නිපදවන්න පුළුවන් බොහොම අඩු ප්‍රමාණයක්. ඉදිමුණු අදහස් ඇති කර ගන්ට එපා; ඒවා කරන්ට බැරි දේවල්. ජලාශයක් බඳින්න පුළුවන්කම තිබෙන්නෙ ඇඹිලිපිටියේ පමණයි," ආදී වශයෙන් නොයෙක් දේවල් කිව්වා. සර් ජෝන් කොතලාවල ඇඹිලිපිටියේ ජලාශයක් බඳින්න මුල් ගලකුත් තිබ්බා. උඩ වලවේ ජලාශයක් බඳින්න පුළුවන් යයි ඒ විශේෂඥයන් කිව්වෙ නැහැ. ලංකාවේ කඳුකරයේ ජලාශ බඳින්න බැරිය කිව්වා.

ගරු සභාපතිතුමනි, දැන් මස්කෙළියේත් ජලාශයක් බඳිනවා. මස්කෙළි ඔය ජලාශයේ වතුර මට්ටම කාසල්රීහි වතුර මට්ටමට වඩා අඩි 350 ක් තරම් උසයි. මුලින්ම කල්පනා කර වඩා හොඳ සැලැස්මවල් අනුව කටයුතු කළා නම් වඩා ප්‍රයෝජනවත් අන්දමින් මේ වැඩ කටයුතු නිම කර ගන්නට ඉඩ තිබුණු බව දැන් අවබෝධ වෙනවා. මස්කෙළි ඔය ජලාශයේ වතුර මට්ටම කාසල්රීහි ජලාශයේ වතුර මට්ටමට වඩා අඩි තුන් සිය ගණනක් උස නිසා කාසල්රීවලටත් මස්කෙළිඔය ජලාශයෙන් වතුර ලබා ගන්ට පුළුවන්කම තිබෙනවා. අද ගල්ඔය තිබෙන අමාරුකම් දෙස බලන විට, විදේශික ඉංජිනේරුවන්ගේ හා විදේශික සංවිධානවල උපදෙස්වලට වහල් නොවී, ඔවුන්ගේ අන්ධ භක්තිකයන් නොවී අපි මුල සිටම ක්‍රියා කළා නම් මීට වඩා ප්‍රයෝජනවත් අන්දමට ඒ කටයුත්ත සාර්ථක කර ගන්නට පුළුවන්කම තිබුණු බව පැහැදිලිව අවබෝධ වෙනවා.

ගරු සභාපතිතුමනි, ඊළඟට මගේ කොට්ඨාශයට අදාළ ප්‍රශ්නයක් ගැන කථා කරන්නටයි මා බලාපොරොත්තු වෙන්නෙ. අකුරුස්ස සුළු නගර සභාවේ පාලනයට යටත් ප්‍රදේශය තුළ කුරුස්ස නගරයට හැතැප්ම ½ ක් පමණ දුරින් දැනට අවුරුදු 75 කට වැඩි කාලයක් තිස්සේ කිසිම වගාවක් නොකරන විශාල ඉඩමක් තිබෙනවා. ඒ ඉඩම පුද්ගලයින් කීප දෙනකුට අයිතියි. ඒ ඉඩමෙ ලොකු ගස් තිබෙන කැලැවක් නැහැ. බෝවිටියා හා දත් පඳුරු ආදියයි තිබෙන්නේ. ඒක හිවළුන් සිටින කැලෑව. ගම් පළල් කිරීමේ ව්‍යාපාරය යටතේ ඒ ඉඩමෙන් අක්කර 200 ක් මහජනයා අතර බෙදා දෙන්න තීරණය කළා. 1961 සිට දිසාපතිවරුන් කීප දෙනකු වාර්තා කර තිබෙනව, මේ ඉඩම අයිතිකරුවන් වගා නොකරන ඉඩමක් නිසා එය රජයට අත් කරගෙන මහජනයා අතර බෙදා දිය යුතුයි කියා. 1964 පෙබරවාරි 19 වෙනිදා ඉඩම් කොමසාරිස්තුමාගේ කාර්යාලයෙන් ඒ ඉඹුල්ගොඩහේන නමැති ඉඩම සම්බන්ධයෙන් මට මෙන්න මේ විධියේ ලියුමක් ලැබුණා:

"ඉඹුල්ගොඩහේන නමැති ඉඩම අත්පත් කර ගැනීම පිළිබව දැනට ස්ථිර, ලේකම්තුමා විසින් පරීක්ෂා කරගෙන යනු ලැබේ. එම අත්පත් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]
ගැනීම පිළිබඳව ස්ථිර ලේකම් තුමාගේ උපදෙස් ලැබුන විට මේ ගැන තවදුරටත් පිළිතුරක් ඔබ වෙත ඉදිරිපත් කරන බැව් දන්වා සිටිමි."

1964 ඔක්තෝබර් 29 වැනි දිනය දරන තවත් ලියමනක් මට ලැබී තිබෙනවා. එයත් මම කියවන්නම්:

"මගේ අංකය: ජේ 63/64 එල් 588 වී.ජී.
1964. 10. 29 දින,
කොළඹ 1, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල
ඇමති කාර්යාලයේදීය.

පාර්ලිමේන්තු මන්ත්‍රී
දොස්තර ඇස්. ඒ. වික්‍රමසිංහ මහතා,
මාතර.

සිතවත් මන්ත්‍රීතුමනි,

ඉඹුල්ගොඩහේන රජයට අත්කර ගැනීම

ඔබේ ඡන්ද කොට්ඨාශයේ ඉළුප්පැල්ල සහ ඉඹුල් ගොඩ ගමෙහි පිහිටි ඉහත සඳහන් ඉඩමෙන් අක්කර 200 ක් පමණ වූ බිම් කොටසක් ගම් පළල් කිරීමේ කටයුතු සඳහා රජයට අයත් කර ගැනීමට තීරණය කර ඇති බවත්, ඒ සඳහා ඉඩම් රජයට අයත් කර ගැනීමේ ආඥපනතේ පස් වැනි වගන්තිය යටතේ ප්‍රකාශනයක් ද අද දින අත්සන් කළ බවත්, දන්වනු කැමැත්තෙමි.

මෙයට,
හිතවත්,
සී. පී. ද සිල්වා."

ඒ අනුව ඉඩම මැන ප්ලෑන් හැදුවා. ඉඩම කැබැලි කැඩුවා. ඒ අනුව එක් අයෙකුට පදිංචියට අක්කර 1/4 යි; වගා කරන්නට අක්කර 1 යි. ආණ්ඩුව කියන අන්දමට තේ හෝ කුරුඳු වගා කිරීම කොන්දේසි ඇතිව සැලැස්මක් පිළියෙළ කර රජයේ මුදල් රුපියල් 4,000 ක් පමණ වියදම් කර වැඩ පිළිවෙළක් ඇති කළා. එහෙත් පසුගිය මාසයේ හදිසියෙන්ම එය තහනම් කළා. ඉතිරිව තිබුණේ ඉඩම් කච්චේරියක් පවත්වා ඉඩම බෙදාදීම පමණයි. එහෙත් ගිය මාසයේ ඒ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම තහනම් කළා. ඉඩම් සාගතයක් තිබෙන ඒ ප්‍රදේශයේ එසේ ඉඩම් බෙදාදීමට ඇති කළ වැඩ පිළිවෙළ දේශපාලන බලපෑම් හා යම් යම් කූට නිලධාරීන්ගේ ක්‍රියාකලාපයන් නිසා නතර වී තිබෙනවා. ඒ ප්‍රදේශය අවට සිටින ඉඩම් නැති අය 500 ක් පමණ දෙනා පසුගිය දිනවල මේ පිළිබඳව පෙත්සමක් ඉදිරිපත් කළා. මා විසිනුයි එම පෙත්සම දිසාපති තුමාට ඉදිරිපත් කළේ. ළඟදීම ගරු අගමැති තුමාටත් එය එවීමට මා බලාපොරොත්තු වෙනවා. දේශපාලන බලපෑම් උඩ මේ අන්දමට අසාධාරණ දේවල් කිරීම වැරදියි. සමහරවිට මේ කරුණ ගැන ගරු අගමැති තුමා නොදන්නවා ඇති. ඒ නිසා මේ කරුණ පිළිබඳව ගරු අගමැතිතුමාගේත් අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. මාස 6 ක පමණ කාලයක සිට මිනින්දෝරු වන් දෙදෙනෙක් එය මැනීමේ කටයුතුවල නියුක්තව සිටියා. එය බෙදාදීමට සකස් කර තිබුණු සැලැස්ම අනුව අක්කර 1 ක් වගා කරන්නට ඕනෑ. එය වගා කළ යුත්තේ රජයේ ඉඩම් නිලධාරීන්ගේ පාලනය යටතේ පොදු සැලැස්මක් අනුවයි. ඒ අන්දමට ආදර්ශමත්ව ඉඩම් ඉල්ලා සිටි අයගේ කැමැත්තත් ඇතිව ඇති කළ මේ වැඩ පිළිවෙළ පසුගිය මාසයේ තහනම් කර තිබෙනවා. ඉඩම මැනීමට පමණක් රුපියල් 2,000 ක් වියදම් කර තිබෙනවා. මා කථා කරන්නේ මෙපමණයි.

අ. භා. 5.55

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! The hon. Second Member for Akurana (Mr. Hameed) will now take the Chair.

අනතුරුව සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ඒ. සී. එස්. හමීඩ් මයා. [අකුරණ දෙවැනි මන්ත්‍රීතුමා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, அக்கிராசனர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, ஜனாப் ஏ. சீ. எஸ். ஹமீது [அக்குறணை இரண்டாவது அங்கத்தவர்] அவர்கள் தலைமை தாங்கினார்கள்.

*Whereupon the Chairman left the Chair, and* MR. A. C. S. HAMEED [Second Member for Akurana] *took the Chair.*

හේමචන්ද්‍ර සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)
(திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)
(Mr. Hemachandra Sirisena—First Akurana)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන අකුරණ ඡන්ද කොට්ඨාශයේ මගේ සහෝදර මන්ත්‍රීතුමා මූලාසනය ගත් අවස්ථාවේදීම ඉඩම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන්නට මට අවස්ථාව ලැබීම ගැන මා ඉතාමත්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සන්තෝෂ වෙනවා. ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා වෙනුවෙන් කථා කිරීමට මට සිදු වී තිබෙන නිසා මට ටිකක් වැඩිපුර කාලය දීමට එතුමාත් එකඟ ඇති.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ඉඩම් අමාත්‍ය අංශය ගැන මේ ගරු සභාවේදී කථා කරනවා නම් අනිකුත් අමාත්‍යාංශ යටතේ කියන්න තිබෙන දේවලට වඩා දීර්ඝ විස්තරයක් සහිතව අපේ කොට්ඨාශවල පවතින තත්ත්වය ගැන දුක්ගැනවිලි ප්‍රකාශයක් කරන්නට තරම් කරුණු තිබෙනවා. අංශ කීපයක් ඒකාබද්ධ වී දෙපාර්තමේන්තු ගණනාවක් පාලනය කරමින් සැලකිය යුතු වග කිව යුතු ජාතික සේවයක් කරන්නට බැඳී සිටින ඉඩම් අමාත්‍යාංශයේ අඩුපාඩුකම් මහත් රාශියක් පෙන්නුම් කරන්නට අපට සිදු වී තිබෙනවා. මට පෙර කථා කළ මන්ත්‍රීවරුන් ගණනාවක්ම කරුණු ගෙන හැර දක්වූයේ මේ ඇමති අංශයේ දුර්වලකම් පිළිබඳවයි. මේ අමාත්‍යාංශය සෑහෙන සේවයක් කරන්නට උත්සාහ ගන්නා බව මා කියන්නට කැමැතියි. එය වඩා වේගවත්ව ක්‍රියාත්මක කරන්නට පුළුවන්කම තිබියදී සමහර අංශවල අවහිරකම් නිසා හෝ කිසියම් දේශපාලන මත භේද තුළින් පැන නැගී ඇති අවහිරකම් නිසා හෝ බලපෑම් නිසා හෝ මෙහි සමහර වැඩ කොටස් කඩාකප්පල් වෙනවා ; අඩාල වෙනවා ; අතපසු වෙනවා. වර්ෂ හත අටක කාලයක් මුළුල්ලේ අප මේ පිළිබඳව මෙම ගරු සභාවෙහි කරුණු ගෙනහැර දක්වනවා. එහෙත්, මෙතෙක් අපගේ ඉල්ලීම් ගැන එතරම් සැලකිල්ලක් මේ ඇමති අංශයෙන් දක්වා නැති බව අපට පෙනෙනවා.

අ. භා. 6

මා නියෝජනය කරන අකුරණ ඡන්ද දායක කොට්ඨාශය, කෘෂිකාර්මික කටයුතු කිරීම සඳහා එතරම් ඉඩකඩ ඇති ප්‍රදේශයක් නොවන බව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් හොඳින් දන්නවා ඇති. රජයේ ඉඩකඩම් අත්පත් කරගෙන බෙදා දී ජනතාව පදිංචි කරවීමට තරම් ඉඩම් තිබෙන ප්‍රදේශයක් නොවෙයි මා නියෝජනය කරන්නේ. මෙය කුඹුරු අස්වැද්දීම සඳහා අවශ්‍ය තැනිතලා භූමි ප්‍රදේශයක් ඇති කොට්ඨාශයකුත් නොවෙයි. කඳුකර ප්‍රදේශයක් වන අකුරණ ඡන්දදායක කොට්ඨාශයෙහි තදබදව වාසය කරන ජනතාවට වියළි කලාපයේ ඉඩම් ලබා දීමට ගරු ඇමතිතුමා ගන්නා උත්සාහය එතරම් සතුටුදායකයයි හිතන්නට පුළුවන්කමක් නැහැ. මධ්‍යම පළාතේ විශාල ඡන්දදායක කොට්ඨාශයක් වශයෙන් සැලකෙන, ලක්ෂ දෙකක පමණ ජනකායක් තදබදයෙන් ජීවත් වන අකුරණ ඡන්දදායක කොට්ඨාශයේ ඉඩම් හිඟය ප්‍රශ් පිළිබඳ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා කෘෂිකාර්මික කටයුතු කරනු පිණිස දක්ෂ ගොවීන්ට වියළි කලාපයේ ඉඩම් ලබාදෙන ලෙස මා ගරු ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැනට මාස දෙක තුනකට පමණ උඩදී මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් කච්චේරියක් පැවැත්වුණා. මේ සඳහා අකුරණ ඡන්ද කොට්ඨාශයෙනුත් ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස චක්‍රලේඛන නිකුත් වී තිබුණා. එහෙත්, අභාග්‍යයකට මෙන්, විශාල ජනකායක් තබදයෙන් වාසය කරන බහු මන්ත්‍රී කොට්ඨාශයක් වන අකුරණ ප්‍රදේශයේ ඉඩම් පිපාසයෙන් වේලී සිටින ජනතාවට ලැබී තිබෙන්නේ ඉඩම් කට්ටි 25ක් 26ක් පමණයි. මා හිතන හැටියට මේ වතාවට අඩු වශයෙන් ඉඩම් කට්ටි 50ක් වත් ලැබුණා නම් අපට සෑහීමට පත් වන්නට පුළුවන්.

ඊළඟට මා විසින් සඳහන් කළ යුතු තවත් කරුණක් තියෙනවා. මීට පෙර ඉඩම් කට්ටිකරුවන් වශයෙන් තෝරා ගන්නට යෙදුණු සමහර ගොවීන්ට මේ වන තෙක් ඉඩම් ලැබී නැහැ. අකුරණ ඡන්දදායක කොට්ඨාශයේ පල්ලේගම්පහ උතුර ගම් සභාවට අයත් අංකුඹුර උඩුගම, අංකුඹුර කිතුල්ගොල්ල ඉහළ මුල්ල යන ගම් ප්‍රදේශයේ ජනතාව අතරින් අවුරුද්දකට පමණ ඉහත ඉඩම් කට්ටිකරුවන් තේරුවා. මේ වන තෙක් ඔවුන්ට ඒ ඉඩම් කට්ටිවල පදිංචි වීමට අවසථාව සලසා දී නැති බව ඔවුන් පෙත්සමක් මාර්ගයෙන් මට කියා එවා තිබෙනවා. ඒ බව මා තමුන්නාන්සේට මෙහිදී ප්‍රකාශ කර සිටිනවා, පෙත්සමක් කියවන්නට කාලයක් නැති නිසා. පසුගිය වතාවේ තෝරාගෙන මේ වන තෙක් ඉඩම් නොදුන්නා වූ කට්ටිකරුවන්ටත්—මිනිපේ ජනපදයේ නාගදීප යන කොටසේ ඉඩම් වලින් අත්හැරී ගිය කොටසටත්—ඉඩම් ලබා ගැනීමට අවසථාවක් සලසා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

ඒ ළඟට මා සඳහන් කරන්නට ඕනෑ වාරිමාර්ග සම්බන්ධව. සුළු වාරිමාර්ග මේ ඉඩම් අමාත්‍යාංශයේ පාලනය යටතේ නැති බවට තර්ක ඉදිරිපත් කර එය පැහැර හරිනවා. මහවැලිගඟ සැතපුම් 5ක 6ක පමණ දුර ප්‍රමාණයක් ගලා බසින්නේ අකුරණ ඡන්ද කොට්ඨාශයේ මායිමක් තුළින්. ගඟේ මට්ටමේ සිට අඩි 7 කට 8 කට වඩා උස නොවන පෙදෙස්වල කුඹුරු යායවල් තිබෙනවා. මේ කුඹුරු යායවලට පොම්ප ක්‍රමයෙන් වතුර ලබා දෙනවා නම් ඒවා ගොවිතැන් කිරීමට පුළුවන් වෙනව. ජල විදුලි බලය දැන් අකුරණ ඡන්දදායක කොට්ඨාශයේ මහවැලි ගඟ අසබඩ දක්වා ලබා දී තිබෙන නිසා ජල විදුලි බලයෙන් වතුර පොම්ප කර මේ කුඹුරුයායවලට වතුර ලබා දෙනවා නම් අකුරණ ඡන්දදායක කොට්ඨාශය තුළින් මීට වඩා අස්වැන්නක් ලබා ගැනීමට පුළුවන් වෙනවා. අඩි හතක් අටක් පහළින් තිබෙන වතුර කුඹුරුවලට ගන්නට පුළුවන්කම තිබෙද්දී ඒ ජලය නිකම්ම මහ මුහුදට ගලා බසිනවා නම් එය මේ අමාත්‍යාංශයේ නොසැලකිල්ල නිසා සිදු වන බවයි, අපට සඳහන් කරන්නට සිදු වී තිබෙන්නේ.

තව එක කාරණයක් පමණක් සඳහන් කරන්නට බලාපොරොත්තු වෙනවා. රාජ්‍ය වැවිලි සංයුක්ත මණ්ඩලය යටතේ පාලනය වන වත්තක් අකුරණ කොට්ඨාශයේ තිබෙනවා. මේ පිළිබඳව නොයෙකුත් අවස්ථාවලදී නොයෙකුත් තර්ක සහ ප්‍රශ්න පමණක් නොව යෝජනාව ඉදිරිපත් වී තිබෙනවා. ඒ එක යෝජනාවක්වත් තවම ක්‍රියාත්මක වෙලා නැහැ. මේ වත්තේ පාලනය නිසියාකාර කරගෙන යනවා නම් කිසිම යෝජනාවක් වුවමනා කරන්නේ නැහැ. මේ වත්තෙන් ආදායම් ලබා ගන්නට පුළුවන් තත්ත්වයක් තිබෙනවා පමණක් නොවෙයි, වත්තේ රැකියාවේ යෙදී සිටින කම්කරුවන්ට දිගටම ස්ථිරව රක්ෂාව සැපයීමටත් පුළුවන් වෙනවා. ඒ මගින් ජාතික ආදායම වැඩි කර ගැනීමටත් පුළුවන්කම තිබෙනවා. යහලේතැන්න දික්පිටිය වත්ත ගැනයි, මා සඳහන් කරන්නේ. යහලතැන්න දික්පිටිය වතු යායේ සේවයේ යෙදී සිටින කම්කරුවන් ගණනාවකගේ රැකියාවන් අහෝසි වන තත්ත්වයක් දැන් උදා වී තිබෙන්නේ ඒ වතුයායේ පාලනය හරියාකාර නොසිදු වන නිසයි. මාස දෙකෙන්, තුනෙන්, හතරෙන්, පහෙන්, හයෙන් මේ වතු යායේ පාලකයන් මාරු වෙනවා. වතු පාලනය ගැන කිසිම දැනුමක් නැති නිලධාරීන් මේ වත්තට අවුත් මාස දෙකක් තුනක් පදිංචිව සිට විවේක ගෙන යනවා වාගෙයි දැන් මේ වතු යායේ පාලනය සිදු වන්නේ. මේ වතු යාය කැබෙලිවලට කඩා ඉඩම් නැති ගම්මුන් අතර බෙදා දීමේ යෝජනාවක්ද ළඟදී ඉදිරිපත් වී තිබෙනවා. මෙම සාරවත් තේ වගාව අක්කර කාල, භාගය, යනාදී වශයෙන් කඩා ගම්මුන් අතර බෙදා දීමෙන් ගම්මුන්ගේ ඉඩම් ප්‍රශ්නය විසඳෙන්නේවත්, ඔවුන්ගේ රැකියා ප්‍රශ්නය විසඳෙන්නේවත් නැහැ. ඒ වාගේම ජාතික ආදායමක්ද නැතිව යනවා. ඒ නිසා කැබෙලිවලට කඩා ගම්මුන් අතර බෙදා දෙනවාට වඩා ඒ වතුයාය දක්ෂ පාලනයක් යටතට පත් කිරීමට ගරු ඇමතිතුමා කටයුතු කරතැයි මා විශ්වාස කරනවා.

තමුන්නාන්සේ යටතේ පාලනය වන ජල විදුලිය ගැන මා නැවතත් මතක් කරන්නට කැමතියි. අකුරණ කොට්ඨාශයේ යෝජිත ජල විදුලි මාර්ග කීපයක්ම තවමත් සම්පූර්ණ වී නැහැ. ළඟදී ජල විදුලි මාර්ග තරමක් දුරට සම්පූර්ණ කර තිබුණත් යෝජිත සැලැස්ම අනුව තව සැතපුම් තුනක් හතරක් පමණ යන තුරු ඒ මාර්ග දීර්ඝ කිරීම ගැන ඇමතිතුමාගේ ගම් පන්සියේ යෝජනා ක්‍රමය පිළිබඳ ලැයිස්තුවෙන් පෙනී යන නිසා ඒ යෝජිත සැලැස්ම සම්පූර්ණ වන ආකාරයට ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙතෙකින් නවත්වනවා.

**පර්සි සමරවීර මයා.** (වැලිමඩ)
(திரு. பேர்சி சமரவீர—வெலிமடை)
(Mr. Percy Samaraweera—Welimada)

ගරු සභාපතිතුමනි, ඉඩම් ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ ඇති සාකච්ඡාවට සම්බන්ධවීමට මා පුල පුලා සිටියේ, 1965 න් පසුව පොදුවේ ඌව පළාතේත්, විශේෂයෙන් වැලිමඩ කොට්ඨාශයේත් ඉඩම් ප්‍රශ්න සහ වාරිමාර්ග ප්‍රශ්න සැලකිය යුතු අන්දමට නිරාකරණය වී තිබෙන නිසා මා නියෝජනය කරන කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන් ගරු ඇමතිතුමාට ස්තුති පූර්වකව වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමටයි. මෙම වැය ශීර්ෂය යටතේ සාකච්ඡාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරම්භ වුණු තැන් පටන් සමහර ගරු මන්ත්‍රීවරුන් තර්ජනාත්මක ස්වරූපයෙන් හා සමහර විට පාර්ලිමේන්තු සම්ප්‍රදාය පවා උල්ලංඝනය වන ආකාරයෙන් ගරු ඇමතිතුමාට දෝෂාරෝපණය කරමින් කථා කළ හැටි මා අසාගෙන සිටියා. මේ රජය පිහිටුවීමෙන් පසුව සී. පී. ද සිල්වා ඇමතිතුමාගෙන් කෙරී ඇති සේවය දිහා බලන විට, එතුමා මේ ඇමතිකම භාර ගත්තේ 1965න් පසුව ද යි මොහොතකට කල්පනා වෙනවා. අවුරුදු 9 ක දීර්ඝ කාලයක් තුළ ඉඩම් ඇමතිකම දරූ එතුමා වාරිමාර්ග දියුණු කරමින් මේ රටේ පොදු මහජනතාවට සේවයක් කිරීමට බලාපොරොත්තු වුණා නම්, ඒ ගැනත් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට ඕනෑ.

අ. භා. 6.15

යම් යම් ගරු මන්ත්‍රීවරුන් ඉඩම් ඇමතිතුමාට විරුද්ධව එල්ල කළ චෝදනා යුක්ති සහගත යයි, මා නම් කොහෙත්ම කල්පනා කරන්නේ නැහැ. වලවේ යෝජනා ක්‍රමය සී. පී. ද සිල්වා ඇමතිතුමාගේ වැඩක් හැටියට හැඳින්වීම වැරදි යයි යම්කිසි මන්ත්‍රීවරයකු ප්‍රකාශ කරනවා නම්, ඒ ප්‍රකාශය වැරදි බව මා කියන්නට කැමැතියි. පරාක්‍රම බාහු රජතුමා ප්‍රමුඛ අනෙකුත් සිංහල රජවරුන් කළ වැව් ආදිය නිසා ඒ රජවරුන්ට යම්කිසි කීර්තියක් අත් වුණා නම්, ගල්ඔය ව්‍යාපාරය—පසු කාලයකදී සේනානායක සමුද්‍රය නමින් හැඳින්වුණු ව්‍යාපාරය—ආරම්භ කිරීම නිසා දිවංගත ඩී. එස්. සේනානායක මහතාට යම්කිසි කීර්තියක් අත් වුණා නම්, වලවේ යෝජනා ක්‍රමයේ නිර්මාතෘවරයා වශයෙන් සී. පී. ද සිල්වා ඇමතිතුමාට කීර්තියක් අත් වීමේ වරද මොකක් දැයි මා ප්‍රශ්න කරන්නට කැමැතියි. වලවේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පිටරටවලින් ලංකාවට ආ ඉංජිනේරුවන්ටත්, ඒ වැඩ කටයුතුවලට සහාය වුණු යම් යම් දෙපාර්තමේන්තුවලටත් මේ රටේ මහ ජනතාවගේ ආදර ස්තුතිය තරමක් දුරට හිමි වෙනවාත් සමගම, ඒ දෙපාර්තමේන්තු ක්‍රියාත්මක කරන ප්‍රධානයාටත්, වලවේ යෝජනා ක්‍රමය බිහි කළ පුද්ගලයාටත් මහ ජන ගෞරවය හිමිවිය යුතු බව ගරු මන්ත්‍රීවරුන් පිළිගන්නවා ඇති. එම නිසා, ඉඩම් ඇමතිතුමා මොන විධියට විවේචනය වුණත් මේ කාල සීමාව ඇතුළත එතුමාගෙන් සේවයක් වුණේ නැතැයි කියන්නට පුළුවන් සමතෙක් මේ ගරු සභාවේ නැහැ. ඒ වාගේම, ගරු අගමැතිතුමාගේ පුරෝගාමිත්වයෙන් 1965 න් පසුව එතුමා කරගෙන යන වාරිමාර්ග කටයුතු සම්බන්ධයෙන් ලක් ජනතාවගේ ප්‍රශංසාව එතුමාට හිමි වෙනවාට කිසිම අඩමානයක් නැහැ.

